# පටුන


**සභාපතිතුමාගේ සමාලෝචනය** ........ 04

**අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව** ........ 06

**සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය** ........ 08

**ප්‍රධාන නිලධාරී මණ්ඩලය** ........ 09

**ආයතනික හැඳින්වීම** ........ 10

හැඳින්වීම ........ 10

දැක්ම හා මෙහෙවර ........ 11

අගනාකම් ........ 11

සංවිධාන ව්‍යුහය ........ 12

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය ........ 13

**විගණන කළමනාකරණ කමිටු වාර්තාව** ........ 15

**ක්‍රියාත්මක වැඩසටහන්** ........ 16

**භෞතික සංවර්ධන වැඩසටහන** ........ 16

*ලුනාව නිවාස ව්‍යාපෘතිය* ........ 16

*රජ්ගම නිවාස ව්‍යාපෘතිය* ........ 17

*හොරණ නාගරික නිවාස ව්‍යාපෘතිය* ........ 18

**මානව සංවර්ධන වැඩසටහන** ........ 19

01. "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා සමාජ - ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කිරීම ........ 19

1.1 *ප්‍රජාව සංවිධාගත කිරීම හා බලගැන්වීම* ........ 20

1.2 *"ස්වශක්ති" ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම* ........ 21

1.3 *ප්‍රජා නායක වැඩමුළු සංවිධානය කිරීම* ........ 21

1.4 *ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු පැවැත්වීම (CAP Workshops)* ........ 22

02. ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන ........ **23**

2.1 *ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගයන්හි ජයග්‍රාහකයින් වෙනුවෙන් ත්‍යාග, කුසලාන හා සහතිකපත් ප්‍රදානය* ........ 23

2.2 *2017 ලෝක ජනාවාස දින වැඩසටහන* ........ 23

2.3 *ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම* ........ 27

2.4 *ජනාවාස ළමුන් සඳහා උපකාරක පංති පැවැත්වීම* ........ 28

2.5 *ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන ආරම්භ කිරීම* ........ 28

2.6 *සංස්කෘතික උත්සවයන් පැවැත්වීම* ........ 29

2.7 *දන්ත වෛද්‍ය සායන පැවැත්වීම* ........ 29

03. තරුණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන් ..... **29**

*3.1 වෘත්තීය පුහුණු වැඩසටහන් හා රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථාවන් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම* ..... 29

*3.2 තරුණ තරුණියන් සඳහා රූපලාවන්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම* ..... 30

*3.3 තරුණ සමිති පිහිටුවීම* ..... 30

04. ව්‍යවසායකත්ව හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන ..... **31**

*4.1 කුඩා කණ්ඩායම් ස්ථාපිත කිරීම* ..... 31

*4.2 "දිරියට දිරියක්" ස්වයං රැකියා මූල්‍ය සහාය සේවා සැපයීම හා උපකරණ සහාය ලබාදීම* ..... 31

*4.3 සුළු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ලබාදුන් අධිවේගී මහන මැෂින්හි පසුවිපරම් කටයුතු* ..... 31

*4.4 "ස්වශක්ති" දිරියට දිරියක් - ස්වයං රැකියා වෙළඳපොළ* ..... 32

05. "සැමට සෙවණ" ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතීන් ජනතා අයිතියට පත් කිරීම ..... **32**

06. පොදු ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන් ..... **33**

*6.1 අක්ෂි පරීක්ෂා කිරීම හා ඇස් කණ්ණාඩි ලබාදීම* ..... 33

*6.2 ප්‍රජා වෛද්‍ය සායනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම* ..... 33

*6.3 සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන* ..... 33

*6.4 ප්‍රජා සමිති වෙත පුටු ලබාදීම* ..... 34

**මූල්‍ය ප්‍රකාශන** ..... 35

ආදායම් හා වියදම් ගිණුම ..... 35

මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය ..... 38

මුදල් ප්‍රවාහ ප්‍රකාශනය ..... 41

ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය ..... 44

**රජයේ විගණන වාර්තාව** ..... 45

# සභාපතිතුමාගේ සමාලෝචනය



නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභී ජනතාවගේ ජීවන තත්ත්වය උසස් කිරීම සඳහා ඔවුන්ගේ නිවාස ඇතුළු භෞතික පරිසරය, සාකල්‍ය නාගරික සහ ජනාවාස සංවර්ධන ප්‍රවේශයක් යටතේ සංවර්ධනය කිරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ මුඛ්‍ය අරමුණ වන අතර ඉලක්ක ප්‍රජාව සමාජ, ආර්ථික සහ සංස්කෘතික වශයෙන් බලගැන්වීම ද අප අධිකාරියේ අරමුණු අතර වේ.

ඒ අනුව මෙම අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා භෞතික හා මානව යන දෙවැදෑරුම් සංවර්ධන ප්‍රවේශය යටතේ වැඩසටහන් සැලසුම් කිරීම සහ ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය 2017 වර්ෂය අවසාන වන විට 10 වන වර්ෂ පූර්ණය සනිටුහන් කරයි.

භෞතික සංවර්ධන ප්‍රවේශය යටතේ මෙම වර්ෂයේදී අවිච්ඡේද ව්‍යාපෘතියක් ලෙස ලුනාව නාගරික නිවාස ව්‍යාපෘතියෙහි ඉදිකිරීම් කටයුතු සිදු කරන ලදි. අඩු පහසුකම් නාගරික ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දීමේ අරමුණින් මොරටුව ලුනාව ග්‍රාම නිලධාරී වසමෙහි මහල් 12 කින් , නිවාස ඒකක 356කින් සමන්විතව ඉදිකෙරෙන අතර 2017 වර්ෂය අවසන් වන  විට 99%ක භෞතික ප්‍රගතියක් සහ රු.මිලි.1,234.22ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

2017 වර්ෂය තුළ නව ව්‍යාපෘතීන් ලෙස හොරණ නාගරික නිවාස ව්‍යාපෘතිය සහ රත්ගම නාගරික නිවාස ව්‍යාපෘතිය ආරම්භ කරන ලදී. හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ වෑවල නැගෙනහිර ග්‍රාම නිලධාරි වසමේ පිහිටි හොරණ නගර සභාවට අයත් "රෝස්වුඩ්වත්ත" ඉඩමේ වසර 35ක පමණ සිට ඉතාමත් අඩු පහසුකම් සහිතව යටතේ ජීවත්වන නගර සභා කම්කරු ප්‍රජා කුටුම්භ 45ක් සඳහා නිවාස විසඳුම් ලබා දීම අරමුණු කරගනිමින් මෙම නිවාස ව්‍යාපෘතිය සැලසුම් කරන ලදි.

2017 වර්ෂය සඳහා රු. මිලි. 34.00ක අයවැය ප්‍රතිපාදන මත මේ වන විට 12% ක භෞතික ප්‍රගතියක් හා රු. මිලි. 2.34ක මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

රත්ගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සුනාමි උවදුරින් අවතැන් ප්‍රජා පවුල් 137 දෙනෙකු  (සිරිකඳුර වත්ත) සඳහා තාවකාලික නිවාස විසඳුම් ලබා දෙමින් ලාභ රාජ්‍ය නොවන සංවිධානයක් (NGO) විසින් ඉදිකළ නිවාසලාභී ප්‍රජාව සඳහා රත්ගම නාගරික නිවාස ව්‍යාපෘතිය සැලසුම් කරන ලදී.

2017 අනුමත අයවැය ප්‍රතිපාදන රු. මිලි 59.00 මත 85% භෞතික ප්‍රගතියක් ද, රු.මිලි.5.66 මූල්‍ය ප්‍රගතියක් ද වාර්තා කර ඇත.

මීට අමතරව නාගරික ජනාවාස වැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ''ස්වශක්ති'' මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 දී ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය තුළ ද මේ යටතේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදි.

2017 ලෝක ජනාවාස දිනය අරමුණු කර ගනිමින් ''සරිලන නිවහනක උරුමය සැමට'' යන තේමාව යටතේ හත්වන වරටත් නාගරික දරු දැරියන්ගේ කලා මංගල්‍යයන් එළිදැක්වීමෙහිලා නව මංපෙත් විවර කරන ලදී.

කුඩා කල සිටම දරුවන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා නාගරික ජනාවාස අධිකාරිය මගින් ක්‍රියාත්මක වැඩසටහනක් ලෙස ළමා ඉතුරුම් වැඩසටහන දැක්විය හැකිය. ඒ අනුව 2017 වර්ෂයේදී ළමුන් 526 දෙනෙකු සඳහා ඉතුරුම් ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.

ආර්ථික දුෂ්කරතාවයන් මත පාසල් අධ්‍යාපනය අතරමඟ නතර කරන හෝ පාසල් අධ්‍යාපනය අවසන් කිරීමත් සමඟ ඇතැම් ජනාවාස තරුණ තරුණියන් විවිධ දුරාචාරයන්ට යොමු වෙමින්, නීති විරෝධී රැකියාවන්හි නිරත වෙමින් ඔවුන්ගේ ජීවිතයේ වටිනා අවස්ථාවන් ඔවුන් කෙරෙන් ගිලිහී යාම බහුලව දක්නට ලැබෙන කරුණකි. මෙම තත්ත්වය තේරුම් ගනිමින් හැකියාවන්ට ගැලපෙන පරිදි වෘත්තීය පාඨමාලා හැදෑරීමට අවශ්‍ය මඟ පෙන්වීම සමාජ සජීවීකරණ අංශයේ නිලධාරීන් විසින් සිදු කරනු ලබන අතර, ඉදිරිපත් වන ඉල්ලුම්පත් සැලකිල්ලට ගනිමින් තරුණ තරුණියන්ගේ වෘත්තීමය කුසලතාවයන් ඔප්නංවාලීම උදෙසා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ ඒකාබද්ධව වෘත්තීමය පුහුණු වැඩසටහන් 2017 වර්ෂය තුළදී ද ක්‍රියාත්මක කරන ලදී.

තම පවුලට ආර්ථිකමය වශයෙන් ශක්තියක් වීම සඳහා කාන්තාවන් බොහෝමයක් ස්වයං රැකියාවන්හි නියුතු වනු ජනාවාසයන් තුළ දක්නට ලැබෙන අතර, එසේ තම පවුලේ ආර්ථිකය නගාසිටුවීම සඳහා කැපවන්නා වූ කාන්තාවන් හට ''ස්වශක්ති'' කාන්තා සවිය වැඩසටහන යටතේ සහනදායී ගෙවීමේ පදනම මත මහන මැෂින් ලබාදීම හා රු. 20,000/- ක උපරිමයකට යටත්ව ඉතා සහනදායී පොළී ප්‍රතිශතයක් මත ණය මුදලක් ලබාදීම අප අධිකාරිය මඟින් සිදු කරනු ලබයි. 2017 වර්ෂයේදී ස්වයං රැකියාලාභීන් 139ක් සඳහා ණය ලබාදීමට කටයුතු කළ අතර, ප්‍රතිලාභීන් සඳහා මහන මැෂින් 36ක් ලබාදීමට කටයුතු කරන ලදී.

යහපත් සෞඛ්‍ය තත්ත්වයක් සඳහා මිනිසාගේ ශාරීරික සෞඛ්‍ය, මානසික සෞඛ්‍ය සහ සමාජ යහපැවැත්ම යන කාරණා මූලික වේ. ඒ අනුව 2017 වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභීන් වෙත සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 434 දෙනෙකු සඳහා වැසිකිළි ආධාර ලබාදීමට කටයුතු කරන ලදී.

මීට අමතරව 2017 වර්ෂය තුළ පවත්වනු ලැබූ සායන 27කින් තෝරාගනු ලැබූ දෘෂ්‍යාබාධ සහිත අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 6006 දෙනෙකු සඳහා ඇස් කණ්ණාඩි ලබාදීමට කටයුතු කරන ලදී.

ඒ අනුව, 2017 වර්ෂය ද අප අධිකාරියේ දැක්ම වන ''තිරසාර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම'' සාක්ෂාත් කර ගැනීම සඳහා කටයුතු කළ වර්ෂයක් ලෙස දැක්විය හැකිය.

**සභාපති**

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# අධ්‍යක්ෂ මණ්ඩල වාර්තාව

2017.12.31 දිනට නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩල පහත පරිදි වේ.

**රංජිත් ශාන්ත කහවල මහතා**
සභාපති

**ඩී. ඒ. පී. අබේසේකර මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**කේ. ඒ. එස්. වල්පොල මහත්මිය**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**කේ. ඒ. ඩී. චන්ද්‍රදාස මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**එල්. එස්. පලන්සූරිය මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ඊ. එල්. ඩබ්. සමරසිංහ මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ඩබ්. එම්. ගුණරත්න මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ඒ. සන්තියාගෝ මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ඩී. ඒ. ගාමිණී මහතා**
අධ්‍යක්ෂ මණ්ඩල සමාජික

**ඉංජි. බෙනඩික්ට් උල්ලුවිස්හේවා මහතා**
අධ්‍යක්ෂ ජනරාල් (අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

සමාලෝචිත වර්ෂය තුළ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් 12 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩලයේ අනු කමිටුවක් ලෙස ක්‍රියාත්මක වන විගණන හා කළමනාකරණ කමිටුව 2017 වර්ෂය තුළදී රැස්වීම 06 ක් පවත්වා ඇත. අධ්‍යක්ෂ මණ්ඩල සමාජිකයින් වන පහත නම් සඳහන් අධ්‍යක්ෂවරුන් විගණන හා කළමනාකරණ කමිටුවේ සමාජිකයින් ලෙස කටයුතු කරති.

ඩී. ඒ. පී. අබේසේකර මහතා- සභාපති

ආචාර්ය මහිම් මෙන්ඩිස් මහතා

ඒ. කේ. පී. විජිත් චන්දිම මහතා

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් අඩු පහසුකම් සහිත නාගරික ජනාවාසවල පදිංචි ජනතාවට නිවාස විසඳුම් සපයා දෙන අතර නාගරික ප්‍රදේශවල පිහිටා ඇති, ජීවත්වීමට සුදුසු තත්වයේ නැති නිවාස සමූහ උසස් තත්ත්වයකට ගෙන ඒමට කටයුතු කරයි. ඒ හා සමගම නාගරික ජනාවාසවල ජීවත් වෙන ජනතාවගේ සමාජ ආර්ථික තත්ත්වය සංවර්ධනය කිරීම පිණිස මානව සංවර්ධන වැඩසටහනක් ද ක්‍රියාත්මක කර ඇත.

1971 අංක 38 දරණ මුදල් පනතේ 12 වැනි සහ 13.6 වැනි වගන්තිය ප්‍රකාරව, නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් සිදු කරනු ලබන සියලුම ගනුදෙනු නිසි පරිදි ගිණුම්ගත කර ගිණුම් පොත් පවත්වාගෙන යාම සහතික කිරීමේ වගකීම සහ අධිකාරියේ ගිණුම් කටයුතුවල සහ අදාළ වර්ෂය සඳහා අතිරික්තයේ/ඌණතාවයේ සත්‍ය සහ සාධාරණ මතයක් සපයාදෙන මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ වගකීම අධිකාරියේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් දරනු ලබයි.

ඒ අනුව නිසි පරිදි ගිණුම් පොත් පවත්වාගෙන යන ලෙසටත්, නිතිපතා පවත්වනු ලබන රැස්වීම්වලදී සහ විගණන කමිටුව හරහා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදය සමාලෝචනය කරන ලෙසටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරිය වෙත නියෝග කර ඇත.

මෙම වාර්ෂික වාර්තාවේ ඉදිරිපත් කර ඇති මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේ දී, සෑම අවස්ථාකටම අදාළ වන පරිදි නිසි ගිණුම්කරණ ප්‍රමිතීන් අනුගත කර ගැනීමත් සාධාරණ සහ විචක්ෂණ විනිශ්චයන් සහ ඇස්තමේන්තු මගින් තහවුරු කිරීමත් අධ්‍යක්ෂ මණ්ඩල වසින් සළකා බලා ඇත.

අධිකාරිය සතු වත්කම් ආරක්ෂා කිරීමටත්, වංචා සහ අනෙකුත් අක්‍රමිකතා සොයා ගැනීමට සහ ඒවා වළක්වා ගැනීමටත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඔවුන්ට ප්‍රායෝගිකව ගත හැකි සියලු ක්‍රියාමාර්ග ගෙන ඇත. මේ සම්බන්ධයෙන් කටයුතු කිරීමේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධිකාරියේ වත්කම් ආරක්ෂා කර ගැනීමට සහ එහි වාර්තාවන්හි නිරවද්‍යතාවය සහ විශ්වාසනීයත්වය ප්‍රායෝගිකව හැකිතාක් දුරට ආරක්ෂා කර ගැනීමට හැකි වන පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සේවාවන් ක්‍රමානුකූල ආකාරයට ඉටු කිරීමට අවශ්‍ය කරන, අභ්‍යන්තර පරීක්ෂා කිරීම, අභ්‍යන්තර විගණන සහ මූල්‍ය හා අනෙකුත් පාලන වලින් සමන්විත ඵලදායි සහ පරිපූර්ණ අභ්‍යන්තර පාලන පද්ධතියක් ස්ථාපනය කර ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,
අධ්‍යක්ෂ මණ්ඩලයේ ලේකම්

**අධ්‍යක්ෂ ජනරාල්**
**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

# සභාපති ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය



රංජිත් ශාන්ත කහවල මහතා
සභාපති



ඩී. ඒ. පී.අබේසේකර මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික




කේ. ඒ. එස්. වල්පොල මහත්මිය
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



කේ. ඒ. ඩී. චන්ද්‍රදාස මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



එල්. එස්. පලන්සූරිය මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ආචාර්ය මහීම් මෙන්ඩිස් මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඊ. එල්. ඩබ්. සමරසිංහ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඩබ්. එම්. ගුණරත්න මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඒ. සන්තියාගෝ මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඒ.කේ.පී.විජිත් චන්දිම මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඩී. ඒ. ගාමිණී මහතා
අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික



ඉංජි. බෙනඩික්ට් උල්ලුවිස්හේවා මහතා
අධ්‍යක්ෂ ජනරාල්
(අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්)

*සටහන : අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික, ඩී. ඒ. පී. අබේසේකර මහතා 2017.12.22 දින ඉල්ලා අස්වීමෙන් පසු එම්. කේ. ප්‍රදීප් කුමාර මහතා එදින සිට මහා භාණ්ඩාගාරික නියෝජිත ලෙස කටයුතු කරන ලදී*

# ප්‍රධාන නිලධාරි මණ්ඩලය



රංජිත් ශාන්ත කහවල මහතා
සභාපති



ඉංජි. බෙනඩික්ට් උල්ලුවිස්සේවා මහතා
අධ්‍යක්ෂ ජනරාල්



වයි. ආර්. ද සිල්වා මහතා
අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ)



ඒ. ජී. එස්. එන්. නිශාන්ති මහත්මිය
අධ්‍යක්ෂ (මුදල්)



කේ. කේ. ඩබ්. ටී. පී. ද සිල්වා මහත්මිය
අධ්‍යක්ෂ (සැලසුම් හා ක. තො. ප)



ඩී. ඒ. දේවිකා දිසානායක මහත්මිය
සහකාර අධ්‍යක්ෂ (නීති)



ඒ. එම්. කේ. බණ්ඩාර අතාවුද මහතා
සහකාර අධ්‍යක්ෂ (මුදල්)



එම්. එස්. වී. විපුලගුණ මහත්මිය
සහකාර අධ්‍යක්ෂ (වාස්තු විද්‍යා)



ඒ. පී. ආර්. ඥානප්‍රිය මහතා
සහකාර අධ්‍යක්ෂ (පරිපාලන)



ඩබ්. පී. යු. කේ. පෙරේරා මහත්මිය
සහකාර අධ්‍යක්ෂ (ඉඩම්)



ආර්. ඩී. එස්. සුසන්ත ප්‍රනාන්දු
සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන)



අභ්‍යන්තර විගණක
එල්. ආර්. ඒ. ශාන්ත මහතා



ඒ. එල්. හර්ෂ දිලංකර මහතා
වැ. බ. සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවීකරණ)

*සටහන : අධ්‍යක්ෂ (මුදල්) එන්.පී.පී. ඩයස් මහතා 2017-07-30 දින විශ්‍රාම ගැනීම මත.*

# ආයතනික හැඳින්වීම

## හැඳින්වීම

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවන ලද්දේ

2008 අංක 36 දරණ

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත මඟිනි.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පිහිටුවීමේ මූලික අරමුණ වූයේ නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම, තිරසර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇතිවනු පිණිස අඩු පහසුකම් නාගරික ජනාවාසවල වෙසෙන ජනතාවගේ ජීවන තත්වය නඟා සිටුවීම හා එම ජනතාවට අවම නාගරික පහසුකම් සඳහා ප්‍රවේශය සලස්වමින් දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම හෝ වඩාත් යහපත් නිවාස පහසුකම් ලබාදීම සඳහා වැඩසටහන් සම්පාදනය කර ක්‍රියාත්මක කිරීම සඳහාත්ය.

## දැක්ම

"තිරසර නාගරික ජනාවාස තුළ උසස් ජීවන රටාවක් සහතික කිරීම"

## මෙහෙවර

"සාකල්‍ය නාගරික සංවර්ධන සැලැස්මකට අනුගතව

ඌණ පහසුකම් සහිත නාගරික ජනාවාසවල සහ

නාගරික කලාපවල වැසියන්ගේ

නිවාස ගැටළුවට විසඳුම් ලබාදීම හා

ඒ හා සමගාමීව ඔවුන් සමාජ, ආර්ථික හා සංස්කෘතික වශයෙන්

සවිබල ගැන්වීම"

## අගනාකම්


- ජනයාගේ ජීවනෝපාය හා සමාජජාල වලට බාධාවීම් අවම කරමින්, සියලු ප්‍රයත්නයන් තුළ සමාජ අවංකභාවය හා සුසංයෝගය අප අගය කරන්නෙමු.

- ප්‍රජාවට පැහැදිලි ප්‍රතිලාභ ලැබෙන සහභාගීත්ව තීරණ ගැනීම දිරිගැන්වීමෙන්, අප සේවය කරන ප්‍රජාවන්ගේ අවශ්‍යතා හා අභිලාෂයන් ගැන අප සැමවිටම සංවේදීව සිටින්නෙමු.

- අප කණ්ඩායමේ සියල්ලන්ටද, අප සේවය කරන ප්‍රජාවගේ සාමාජිකයින්ටද අප සලකනුයේ අප සැලකිලි ලැබීමට කැමති ආකාරයටය.

- නවෝත්පාදනය, කණ්ඩායමක් වශයෙන් වැඩකිරීම සහ හවුල්වීම් අප විසින් දිරිගන්වන අතර, අපගේ සියලුම කර්තව්‍යයන්හිදී ආචාර විද්‍යාත්මක හා වෘත්තීමය ප්‍රමිතීන් පවත්වාගෙන යන්නෙමු.

# සංවිධාන ව්‍යුහය




ක.ස. 1-1 20
<u>රා.ප. චක්‍ර ලේක 25/2014 අනුව</u>
තා.ස - තාක්ෂණික සහකාර 03
සමාජ සංවර්ධන සහකාර - 03
ක.ස - කළමනාකරණ සහකාර 10
කා.කා.ස - කාර්යාල කාර්යය සහායක 04
රියදුරු - 01

ස.අ/නි.අ - සහකාර අධ්‍යක්ෂ / නියෝජ්‍ය අධ්‍යක්ෂ
සැල.සහ. (පර්. හා සං.) - සැලසුම් සහකාර (පර්යේෂණ හා සංවර්ධන)
සැල.සහ. (ක.තො.ප) - සැලසුම් සහකාර (කළමනාකරණ තොරතුරු පද්ධති)
සැල.සහ. (සංඛ්‍යා) - සැලසුම් සහකාර (සංඛ්‍යාන)
සැල.සහ. (පර්) - සැලසුම් සහකාර ()
දත්.සැක සහ. - දත්ත සැකසුම් සහකාර

පද්. විශ්. - පද්ධති විශ්ලේෂක
සං. නිල. - සංවර්ධන නිලධාරී
තා.ස - තාක්ෂණික සහකාර
ක.ස - කළමනාකරණ සහකාර
කා.කා.ස - කාර්යාල කාර්යය සහායක

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කාර්ය මණ්ඩලය

2017-12-31 දිනට

| | තනතුර | අනුමත ප්‍රමාණය | දැනට සිටින ප්‍රමාණය | | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | | |
| 01 | අධ්‍යක්ෂ ජනරාල් | 01 | 01 | - | | |
| 02 | අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ) | 01 | 01 | - | | |
| 03 | අධ්‍යක්ෂ (සැලසුම් හා ක.තො.ප) | 01 | 01 | - | | |
| 04 | අධ්‍යක්ෂ (මුදල්) | 01 | 01 | - | | |
| 05 | අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | | - | 01 | |
| 06 | අභ්‍යන්තර විගණක | 01 | 01 | - | | |
| 07 | සහකාර අධ්‍යක්ෂ (මුදල්) | 01 | 01 | - | | |
| 08 | සහකාර අධ්‍යක්ෂ (ප්‍රසම්පාදන) | 01 | 01 | - | | |
| 09 | සහකාර අධ්‍යක්ෂ (ඉංජිනේරු) | 01 | - | - | 01 | |
| 10 | සහකාර අධ්‍යක්ෂ (වාස්තුවිද්‍යා) | 01 | - | - | 01 | |
| 11 | සහකාර අධ්‍යක්ෂ (සමාජ සජීවිකරණ) | 01 | - | - | 01 | |
| 12 | සහකාර අධ්‍යක්ෂ (නීති) | 01 | 01 | - | | |
| 13 | සහකාර අධ්‍යක්ෂ (ඉඩම්) | 01 | 01 | - | | |
| 14 | සහකාර අධ්‍යක්ෂ (පර්යේෂණ හා සංවර්ධන) | 01 | - | - | 01 | |
| 15 | සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) | 01 | 01 | - | | |
| 16 | පරිපාලන නිලධාරි | 01 | - | - | 01 | |
| 17 | තාක්ෂණ නිලධාරි | 01 | - | - | 01 | |
| 18 | ඉංජිනේරු සහකාර | 01 | - | - | | |
| 19 | සංවර්ධන නිලධාරි | 04 | 04 | - | | |
| 20 | පද්ධති විශ්ලේෂක | 01 | 01 | - | | |
| 21 | සැලසුම් සහකාර | 01 | 01 | | | |
| 22 | දත්ත සැලසුම් සහකාර | 01 | - | - | 01 | |
| 23 | සැලසුම් සහකාර (ක.තො.ප) | 01 | 01 | - | | |

| | තනතුර | අනුමත ප්‍රමාණය | දැනට සිටින ප්‍රමාණය | | පුරප්පාඩු | අතිරික්ත |
|---|---|---|---|---|---|---|
| | | | ස්ථිර | කොන්ත්‍රාත් | | |
| 24 | සැලසුම් සහකාර (පර්යේෂණ) | 01 | 01 | - | | |
| 25 | සැලසුම් සහකාර (සංඛ්‍යාන) | 01 | 01 | - | | |
| 26 | නීති සහකාර | 01 | 01 | - | | |
| 27 | ප්‍රජා සංවර්ධන සහකාර | 20 | 17 | - | 03 | |
| 28 | තාක්ෂණික සහකාර | 12 | 09 | - | 04 | 01 |
| 29 | සැලසුම් ශිල්පි | 01 | 01 | - | | |
| 30 | ක්‍රමලේඛක | 01 | 01 | - | | |
| 31 | කළමනාකරණ සහකාර (තා.නො) | 20 | 29 | 02 | | 09 |
| 32 | දත්ත සටහන් ක්‍රියාකරු | 02 | 02 | - | | |
| 33 | සමාජ සංවර්ධන සහකාර | 10 | 10 | - | | |
| 34 | රියදුරු | 10 | 11 | - | | 01 |
| 35 | ප්‍රථමික ශිල්පිය නොවන /කාර්යාල කාර්ය සහයක | 09 | 13 | - | | 04 |
| 36 | ලේඛන භාරකරු | 01 | 01 | - | | |
| 37 | ගබඩාභාරකාර සහායක | 01 | 01 | - | | |
| | එකතුව | 116 | 115 | 02 | 15 | 15 |

- ද්විතියන පදනමින් - සහකාර අධ්‍යක්ෂ - 01
  රියදුරු - 05
- අතිරික්ත 15 ලෙස දැක්වෙනුයේ රා.ප චක්‍රලේඛ අංක 25/2014 අනුව බඳවාගත් 15 දෙනෙකුය.

# විගණන හා කළමනාකරණ කමිටු වාර්තාව

මනා මූල්‍ය වාර්තාකරණ ක්‍රමවේදයක් පවතින බව සහතික කිරීම සඳහා සහ කළමනාකරණයට සහ අදාළ බලධාරීන්ට නිවැරදි, යෝග්‍ය සහ කාලීන වූ තොරතුරු සපයා දීමට හැකිවන පරිදි එය හොඳින් කළමනාකරණය කෙරෙන බව සහතික කිරීම සඳහාත්, නීති සහ අධිකාරියේ ප්‍රතිපත්තිවලට සහ ව්‍යවස්ථාපිත සහ සංස්ථාපිත පාලනයන්ට අනුකූල වන පරිදි ගිණුම්කරණ සහ අභ්‍යන්තර පාලන කළමනාකරණය කිරීම සඳහාත්, සමාලෝචනය කිරීමේ සහ අධීක්ෂණය කිරීමේ බලතල විගණන හා කළමනාකරණ කමිටුවට පැවරී තිබේ.

අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත සහ අනෙකුත් අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයින් දෙදෙනෙකුගෙන් (02) විගණන කමිටුව සමන්විත විය. රාජ්‍ය ව්‍යවසාය මාර්ගෝපදේශයන්ට අනුව අධ්‍යක්ෂ මණ්ඩලයේ භාණ්ඩාගාර නියෝජිත, අතිරේක අධ්‍යක්ෂ ජනරාල් - විදේශ සම්පත් දෙපාර්තමේන්තුව, ඩී. ඒ. පී. අබේසේකර මහතා 2017-12-22 වර්ෂයේ කමිටු සභාපති ලෙස කටයුතු කළේය. ආචාර්ය මහීම් මෙන්ඩිස් සහ ඒ. කේ. පී. විජිත් චන්දිම යන මහත්වරු කමිටු සාමාජිකයින් ලෙස කටයුතු කළහ.

රජයේ විගණන අධිකාරී සහ රේඛීය අමාත්‍යාංශයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක නිරීක්ෂකයන් ලෙස විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම්වලට සහභාගි වූ අතර අවශ්‍ය පරිදි නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ අංශ ප්‍රධානීන් හා අවශ්‍ය අවස්ථාවන්හීදි අනෙකුත් නිලධාරීන්ද රැස්වීම්වලට සහභාගි විය. අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් කමිටුවේ ලේකම් ලෙස කටයුතු කළේය. අභ්‍යන්තර විගණක විසින් සකස් කරන ලද 2017 වර්ෂය සඳහා වූ අභ්‍යන්තර විගණන සැලැස්ම කමිටුව විසින් සලකා බලා අනුමත කරන ලදි.

සමාලෝචිත වර්ෂය තුළ කමිටුව රැස්වීම් වාර 06 ක් පවත්වා ඇත. විගණන වාර්තා, විගණන විමසුම්වලට අදාළ ගැටළු සහ පිළිතුරු, අභ්‍යන්තර හා බාහිර විගණනයන්හි නිරීක්ෂණ, අභ්‍යන්තර පාලන පද්ධතීන් මෙන්ම වාර්ෂික වාර්තාව නිසිකලට සකස් කර ඉදිරිපත් කිරීමේ අවශ්‍යතාවය පිළිබඳවද විශේෂ අවධානය යොමු කිරීමද ඇතුළත්ව වැඩි දියුණු කිරීම් අවශ්‍ය අනෙකුත් ක්ෂේත්‍ර පිළිබඳව කමිටුව සාකච්ඡා කරන ලදි. අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර, ගනු ලැබූ තීරණවලට අදාළ පසු විපරම් ක්‍රියාමාර්ගද සාකච්ඡා කරන ලදි. සාකච්ඡා කරන ලද ප්‍රමුඛ කරුණු ඇතුළත් රැස්වීම් සාකච්ඡා සටහන් අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

සාමාජිකයින් සහ නිලධාරීන් විසින් ලබාදුන් වටිනා දායකත්වය මෙන්ම විශේෂයෙන්ම විගණන ක්‍රියාවලියේදී විගණකාධිපති විසින් ලබාදුන් ඉතා වටිනා නිරීක්ෂණයන්ද මම අවංකවම ඉතා අගය කොට සළකමි.

විගණන හා කළමනාකරණ කමිටුවේ අණ පරිදි,

විගණන හා කළමනාකරණ කමිටු ලේකම්,

**අධ්‍යක්ෂ ජනරාල්**

*නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය*

## භෞතික සංවර්ධන වැඩසටහන

නාගරික අඩු පහසුකම් නාගරික ප්‍රජාවගේ නිවාස විසඳුම් ලබා දීම හා මෙම ඉලක්ක ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කිරීමේ අරමුණින් 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනත මගින් ස්ථාපිත නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය, 2017 වර්ෂයේ දී පහත සඳහන් ව්‍යාපෘති භෞතික සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කර ඇත.

- ලුනාව නිවාස ව්‍යාපෘතිය (අවිච්ඡේද)
- හොරණ නිවාස ව්‍යාපෘතිය (නව)
- රජගම නිවාස ව්‍යාපෘතිය (නව)

### ලුනාව නිවාස ව්‍යාපෘතිය



අඩු පහසුකම් නාගරික ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දීමේ අරමුණින් මොරටුව ලුනාව තානායම් ඉඩමෙහි මහල් 12 කින් (G+11) නිවාස ඒකක 356 කින් සමන්විතව රු.මිලි.1,267.316 ක මූල්‍ය ඇස්තමේන්තුවක් සහිතව ලුනාව නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීම සඳහා සැලසුම් කරන ලදි. ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව (SEC) විසින් ඉදිකිරීම් කටයුතු කරන අතර ව්‍යාපෘති කළමනාකරණය රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව (SD&CC) සිදු කරනු ලබයි.

| | |
|---|---|
| නිවාස ඒකක ගණන | 356 |
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය (රු.මිලි.) | 1,267.316 |
| 2017.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය | |
| භෞතික | 99 % |
| මූල්‍ය (රු.මිලි.) | 1,234.22 |
| මූල්‍ය ප්‍රතිපාදන උපයෝජනය | 97 % |

## රජගම නිවාස ව්‍යාපෘතිය

රජගම ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයේ සුනාමි උවදුරින් අවතැන් සිරිකඳුර වත්ත ප්‍රජා පවුල් 137 සඳහා තාවකාලික නිවාස විසඳුම් ලබා දෙමින් රාජ්‍ය නොවන සංවිධානයක් (NGO) විසින් ඉදිකළ නිවාසවල සෞඛ්‍ය ආරක්ෂිතව ජීවත් වීමට නොහැකි වීම හේතුවෙන් ප්‍රජාව සඳහා රජගම නාගරික නිවාස ව්‍යාපෘතිය සැලසුම් කරන ලදී. ජාතික ගොඩනැගිලි පර්යේෂණ ආයතනය (NBRO) විසින් නිකුත් කරන ලද තාක්ෂණික වාර්තාවේ මෙම නිවාස ඉදිකිරීම සඳහා භාවිතා කල අමුද්‍රව්‍ය ශරීර සෞඛ්‍යයට සුදුසු නොවන බව සඳහන් කර ඇත. එමෙන් ම මේ වන විට ඇතැම් නිවාස අබලන් තත්ත්වයට ද පත් වී ඇත.

නිවාස ඒකක 137 ක් සඳහා නිවාස ණය හා ආධාර ලබා දීම සඳහා රු. මිලි 76.547 මුළු ඇස්තමේන්තුගත පිරිවැයක් සකසා ව්‍යාපෘතිය සැලසුම් කර ඇත.

සුදුසුකම් පරීක්ෂා කිරීමේ කමිටු රැස්වීමේ දී අනාවරණ වූ තොරතුරු අනුව සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ මුල් පදිංචිකරුවන් සඳහා ආධාර මුදලක් ලෙස ද, සුනාමි ව්‍යසනයට මුහුණ නොදුන් වර්තමාන පදිංචිකරුවන් සඳහා ණය මුදලක් ද ලබා දීමට මෙහිදී කටයුතු කෙරේ.

2017 අනුමත අයවැය ප්‍රතිපාදන රු. මිලි 59.00 මත 85% භෞතික ප්‍රගතියක් ද රු. මිලි 5.66 මූල්‍ය ප්‍රගතියක් ද වාර්තා කර ඇත. 2018 වර්ෂය සඳහා අපේක්ෂිත අයවැය ප්‍රතිපාදන රු. මිලි 13.35 කි.

### ව්‍යාපෘති සාරාංශය - රජගම නාගරික නිවාස ව්‍යාපෘතිය

| | |
|---|---|
| නිවාස ඒකක/ ප්‍රතිලාභීන් ගණන | 102 (තනි නිවාස ඒකක) |
| ඉලක්ක ප්‍රතිලාභීන් | • සුනාමි ව්‍යසනයෙන් අවතැන් වූ මුල් පදිංචිකරුවන් සඳහා **නිවාස ආධාර ලබාදීම**<br>අලුතින් ඉදිකළ යුතු නිවාස ප්‍රතිලාභියකු සඳහා - රු. 600,000.00<br>වැඩිදියුණු කළ යුතු නිවාස ප්‍රතිලාභියකු සඳහා - රු. 300,000.00<br>*(සුවිශේෂී අවස්ථාවන්හිදී හැර )*<br>• සුනාමි ව්‍යසනයට මුහුණ නොදුන් පදිංචිකරුවන් (2014 වර්ෂයේ ව්‍යාපෘති වාර්තාව සකසන විට පදිංචි වී සිටි) **සඳහා නිවාස ණය ලබා දීම**<br>අලුතින් ඉදිකළ යුතු නිවාස ප්‍රතිලාභියකු සඳහා - රු. 600,000.00<br>වැඩිදියුණු කළ යුතු නිවාස ප්‍රතිලාභියකු සඳහා - රු. 300,000.00<br>(සුවිශේෂී අවස්ථාවන්හිදී හැර ) |
| ව්‍යාපෘති පිහිටීම | හික්කඩුව ප්‍රාදේශීය ලේකම් බලප්‍රදේශයට අයත් "සිරිකඳුරවත්ත" ඉඩම |
| ව්‍යාපෘති කාල සීමාව | වසර 1 1/2 |
| මුළු ඇස්තමේන්තුගත පිරිවැය | රු. මිලි. 76.547 |
| අනුමත අයවැය ප්‍රතිපාදන - 2017 | රු. මිලි. 63.20 |
| අපේක්ෂිත අයවැය ප්‍රතිපාදන - 2018 | රු. මිලි. 13.35 |
| 2017.12.31 දිනට සමුච්චිත ප්‍රගතිය (2017 අයවැය ප්‍රතිපාදන මත)<br>භෞතික<br>මූල්‍ය | <br><br>85%<br>රු. මිලි 52.65 |

## හොරණ නාගරික නිවාස ව්‍යාපෘතිය

හොරණ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෑවල නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ පිහිටි හොරණ නගර සභාවට අයත් ‘‘රෝස්වුඩ්වත්ත’’ ඉඩමේ වසර 35ක පමණ සිට ව. අ. 80 පමණ ඉඩ ප්‍රමාණයක තාවකාලික නිවාස ඉතාමත් අඩු පහසුකම් සහිතව යටතේ ජීවත්වන නගර සභා කම්කරු ප්‍රජාව සඳහා නිවාස විසඳුම් ලබා දෙමින්, සමාජීය ආර්ථික තත්ත්වය නගා සිටුවීමේ අරමුණින් හොරණ නාගරික නිවාස ව්‍යාපෘතිය සැලසුම් කරන ලදි. මෙම නිවාස ව්‍යාපෘතිය හරහා පර්චස් 80 පමණ වටිනා නාගරික භූමි ප්‍රමාණයක් නාගරික ප්‍රතිසංවර්ධනය සඳහා නිදහස් කර ගැනීමේ හැකියාව ද උදා වේ.

කළුතර දිස්ත්‍රික්කයේ මිල්ලනිය ප්‍රාදේශීය ලේකම් බල ප්‍රදේශයට අයත් ‘‘හෑගල්ලවත්ත’’ ඉඩමේ මුලික නිවාස ඉදිකිරීම් කටයුතු ආරම්භ කර ඇත.

2017 වර්ෂය සඳහා රු. මිලි. 34.00 අයවැය ප්‍රතිපාදන මත වර්ෂය අවසාන වන විට 12% භෞතික ප්‍රගතියක් හා රු. මිලි. 2.34 මූල්‍ය ප්‍රගතියක් වාර්තා කර ඇත.

ව්‍යාපෘතිය සඳහා මූලිකව සැලසුම් කරන ලද වවුල්ගලවත්ත ඉඩම ප්‍රතිලාභී විරෝධය හේතුවෙන් හෑගල්ලවත්ත ඉඩම තෝරා ගැනීමට සිදු විය.

## මානව සංවර්ධන වැඩසටහන

### “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන

2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරී පනතින් පැවරුණ කාර්යභාරයක් ලෙස ඌන පහසුකම් සහිත නාගරික ජනාවාසයන්හි ජීවත් වන ප්‍රජාවගේ ආර්ථික, සමාජීය, සංස්කෘතික ප්‍රවර්ධනය උදෙසා එම ප්‍රජාව බලගැන්වීම මෙන්ම ඔවුන්ගේ දරුදැරියන්ගේ දැනුම, කුසලතා හා ආකල්පමය වශයෙන් ධනාත්මක ප්‍රවේශයකට යොමු කිරීම උදෙසා “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන නාගරික ජනාවාස මට්ටමින් ක්‍රියාවට නැංවීමේ වගකීම මෙම අධිකාරියට පවරා ඇත.

උක්ත කාර්යයන් ක්‍රියාවට නැංවීම සඳහා “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන යටතේ පහත ක්‍රියාකාරකම් නාගරික ජනාවාස මට්ටමින් ඉටු කරන ලදී.

1. ප්‍රජාව සංවිධාන ගත කිරීම හා බලගැන්වීම
2. ළමා කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්
3. තරුණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්
4. ව්‍යවසායකත්ව හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන්
5. “සැමට සෙවණ” ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතීන් ජනතා අයිතියට පත් කිරීම
6. පොදු ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන්

ඒ අනුව නාගරික ජනාවාස වැසියන්ගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන වර්ෂ 2011 දී ආරම්භ කරන ලද අතර 2017 වර්ෂය තුළ ද මේ යටතේ මූලික අරමුණු ඉටුකර ගැනීම සඳහා විවිධ වැඩසටහන් ක්‍රියාත්මක කෙරේ.

### 01 “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන පිළිබඳව ප්‍රජාව දැනුවත් කිරීම හා සමාජ - ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කිරීම

“ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන යටතේ පවුල් ලියාපදිංචිය හා තොරතුරු ලබා ගැනීම නව ජනාවාසන්හි සිදුකළ අතර, එහිදී “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහනේ අරමුණු සහ ක්‍රියාකාරකම් පිළිබඳව ජනාවාස ප්‍රජාව දැනුම්වත් කිරීම සිදු කරන ලදී.

මෙහිදී කොළඹ නාගරික කලාප මෙන්ම කොළඹින් පිටත දිස්ත්‍රික්කයන්හි “සැමට සෙවණ” ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතීන් ද ඇතුළත් විය. කොළඹ නාගරික කලාපය තුළ පවුල් 345 ක් ද, පිටපළාත්හි පවුල් 202 ක් 2017 වර්ෂයේදී අළුතින් ලියාපදිංචි කර ඇත.

## 1.1 ප්‍රජාව සංවිධාගත කිරීම හා බලගැන්වීම

*1.1.1 කොළඹ දිස්ත්‍රික්කයේ නාගරික බල ප්‍රදේශයන් ආවරණය කරමින් "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම, නව ජනාවාසයන් හඳුනාගැනීම, සමාජ - ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කිරීම.*



*පවුල් සමීක්ෂණ කටයුතු සිදු කරමින්*

*1.1.2 අනුරාධපුරය දිස්ත්‍රික්කයේ අලිවංගුව "ඇත්පවුර" ගම්මානයේ "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක කිරීමට අදාළව සමාජ - ආර්ථික සමීක්ෂණ කටයුතු සිදු කිරීම*

අලිවංගුව - ඇත්පවුර ගම්මානය මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට තෝරාගත් අනෙකුත් ජනාවාසයන් හා සැසඳීමේදී හාත්පසින්ම වෙනස් ජන කණ්ඩායමක් ජීවත්වන්නා වූ ගම්මානයක් ලෙස දැකිය හැකිය. සිඟමන තම ජීවනෝපාය කරගනිමින් විවිධ ප්‍රදේශයන්හි විසිරී සිටි පිරිසක් තම ජීවන වෘත්තිය අත්හරිමින් ශිෂ්ටසම්පන්න ජීවන රටාවකට අනුගත වීම සඳහා ගත් උත්සාහයක ප්‍රතිඵලයකි "අලිවංගුව" ගම්මානය බිහිවීම.

එහෙත්, අසම්පූර්ණ ජීවන පැවැත්මක් සහිත මෙම ප්‍රජාව සඳහා නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය මැදිහත් වෙමින් ඔවුන්ගේ සමාජ පසුබිම යහපත් කිරීමේ අරමුණින් මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාවට නංවනු ඇත.

ගල්නෑව ප්‍රාදේශීය ලේකම්තුමිය සම්බන්ධීකරණය කර ජංගම කාර්යාලයක් 2017.04.03 වන දින ජනාවාසයේදී පැවැත්විණි.



එහිදී, මෙම ගම්මානයේ ජීවත් වන උප්පැන්න සහතික නොමැති පුද්ගලයින් හට උප්පැන්න සහතික ලබාදීම, පාසල් නොයන දරුවන් අධ්‍යාපනය සඳහා යොමු කරවීම හා නීත්‍යනුකූලව විවාහ නොවී එක්ව ජීවත් වන පුද්ගලයන් නිත්‍යනුකූලව විවාහ කරදීම, වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් බඳවාගැනීම, ඉඩම් කොටස් සම්බන්ධයෙන් පවතින ගැටලු නිරාකරණය කිරීම, දිවිනැගුම දෙපාර්තමේන්තුව සම්බන්ධ කරගනිමින් එම ජනතාවගේ ආර්ථිකය ශක්තිමත් කරගැනීමට කටයුතු කිරීම ආදී වැඩසටහන් රැසක් ක්‍රියාත්මක කෙරුණි.



*විවාහයන් ලියාපදිංචි කිරීමේ කටයුතු සිදු කරමින්*



රාජ්‍ය නිලධාරීන් ප්‍රජාවගේ ගැටලු සඳහා ඉදිරිපත් වෙමින්

## 1.2 "ස්වශක්ති" ප්‍රජා මූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම

*1.2.1 කොළඹ නාගරික කලාපය තුළ ප්‍රජාමූල සංවිධාන ස්ථාපිත කිරීම හා යාවත්කාලීන කිරීම*

තම ජනාවාසයේ උන්නතිය උදෙසා එක්ව කටයුතු කිරීමේ වැදගත්කම හා වටිනාකම ප්‍රජාමූල සංවිධාන බිහිකිරීම තුළින් පැහැදිලි වන්නා වූ කරුණකි. ජනාවාස ප්‍රජාවන්ට පැමිණෙන්නා වූ නොයෙකුත් අභියෝගයන්ට මුහුණ දීමට මූලික පදනම ප්‍රජාමූල සංවිධාන හරහා සිදු වේ.

මේ යටතේ 2017 වර්ෂය තුළ උතුරු කොළඹ, මැද කොළඹ, නැගෙනහිර / බටහිර කොළඹ, බොරැල්ල කලාපයට අයත් ප්‍රජා මූල සංවිධාන 21ක් ස්ථාපිත කළ අතර, පවත්වාගෙන යනු ලබන ප්‍රජා මූල සංවිධාන යාවත්කාලීන කිරීමද සිදු කරන ලදී.





## 1.3 ප්‍රජා නායක වැඩමුළු සංවිධානය කිරීම

මානව සංවර්ධන වැඩසටහන් ජනාවාසයන් තුළ ක්‍රියාත්මක කිරීමේදී වර්ෂයට අදාළ ප්‍රජා ක්‍රියාකාරී සැලස්ම සකස් කිරීමට හා ජනාවාසයන්හි ප්‍රජාවගේ ආර්ථික, සමාජීය හා සංස්කෘතික සුබසාධනය සඳහා නව යෝජනා ලබාගැනීමට ජනාවාසයන් ආවරණය වන පරිදි ප්‍රජා ක්‍රියාකාරීන් හා ප්‍රජා නායකයින් සම්බන්ධ කරගනිමින් කලාප මට්ටමින් ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු පවත්වන ලදී. මෙහිදී ජනාවාසයන්හි ඉදිරි දියුණුව සඳහා වැදගත්වන්නා වූ තීරණ රැසක් ගනු ලැබීය.



*ක්ෂේත්‍ර නිලධාරීන් විසින් ප්‍රජාව සමඟ ගැටලු සාකච්ඡා කරමින්*

2017 ලෝක ජනාවාස දිනට සමගාමීව ප්‍රජා නායකයින් දැනුවත් කිරීමේ වැඩමුළුව 2017.08.06 වන දින සච්සිරිපායේදී පැවැත්වූ අතර, වැඩමුළුව පැවැත්වීමේ මූලික අරමුණුක් ලෙස වර්ෂ 05ක් පුරාවට ක්‍රියාත්මක කළ "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන් පිළිබඳව ප්‍රජා නායකයින් සමඟ සමාලෝචනය කර එම වැඩසටහන් යාවත්කාලීන කිරීමට ප්‍රජා නායකයින්ගේ අදහස් ලබාගැනීම සිදු කෙරිණි. නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් 2017 ලෝක ජනාවාස දිනය ඔක්තෝබර් මස 02 වන දින සැමරීමේ ජාතික වැඩසටහනට සමගාමීව අධිකාරිය මඟින් සිදු කරන ලද හා සිදු කිරීමට යෝජිත පුළුල් වූ විවිධ වැඩසටහන් පිළිබඳව ප්‍රජා නායකයින් දැනුවත් කිරීම හා වැඩසටහනේ සාර්ථකත්වයට ප්‍රජා නායක

සම්බන්ධතා පවත්වාගැනීම තවත් එක් ප්‍රධාන අරමුණක් ලෙස දක්වන ලදී.

මානව හැකියා පුහුණුකරු සනත් ගමගේ මහතාගේ සම්පත් දායකත්වය මත මානව හැකියා සංවර්ධනය පිළිබඳ විශේෂ දේශනයක් ප්‍රජා නායකයින් දැනුවත් කෙරිණි. ප්‍රජා නායකයෙකු බිහිවීම හා ප්‍රජා නායකයෙකුට තම හැකියා වර්ධනය කරගැනීමට තමන් සතු හැකියාවන්, ශක්තීන් හා ආරෝපණය කළ යුතු ගුණාංග පිළිබඳ "නායකත්වය" යන්න තේමාව කොටගෙන පැවතිය යුතු, හැසිරිය යුතු, හඳුනාගත යුතු චර්යාවන් එහිදී උදාහරණ දක්වමින් පැහැදිලි කරන ලදී.

මෙම වැඩමුළුව සඳහා ප්‍රජා නායකයින් 90 දෙනෙකු සහභාගී වූ අතර, ජනාවාසවල ජීවත් වන ප්‍රජාවගේ ජීවන තත්ත්වය නගාසිටුවීම උදෙසා සක්‍රීයව තම ප්‍රජාවට නායකත්වය ලබාදීම වෙනුවෙන් සහතික පත්‍රයක් ද වැඩසටහන අවසානයේදී නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සභාපතිතුමන් විසින් ප්‍රදානය කරන ලදී.



මානව හැකියා පුහුණු විශේෂඥ සනත් ගමගේ මහතා විසින් වැඩමුළුව මෙහෙයවමින්

## 1.4 ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු පැවැත්වීම (CAP Workshops)

කිසිදු රාජ්‍ය ආයතනයක හෝ වෙනත් වගකිව යුතු ආයතනයක මැදිහත්වීමක්, උපකාරයක් නොමැති ජනාවාසයන්හි ප්‍රජාව කෙරෙහි වූ ඔවුන්ට පමණක් විසඳාගත නොහැකි ගැටලු සම්බන්ධයෙන් විසඳුම් සෙවීමේ අරමුණින් රාජ්‍ය නිලධාරීන්, ප්‍රජා නායකයින් හා ජනාවාස ප්‍රජාව සම්බන්ධ කරගනිමින් ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු කොළඹ නාගරිකයේ ජනාවාස මුල්කරගනිමින් හා කොළඹින් පිටත මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතීන්හි ක්‍රියාත්මක කර ඇත.

ඒ අනුව කොළඹ නාගරික කලාපයන් ආවරණය කරමින් ප්‍රජා ක්‍රියාකාරී වැඩමුළු ක්‍රියාත්මක කළ අතර, එතුළින් ජනාවාස ප්‍රජාවන් අත්කරගත් ප්‍රතිලාභයන් ද බොහෝ ය.

- **උතුරු කොළඹ කලාපය** -
  ජනාවාස 56 ක් ආවරණය කරමින් වැඩමුළු 22 ක් පවත්වන ලදී
- **නැගෙනහිර / බටහිර කොළඹ කලාපය** -
  ජනාවාස 47 ක් ආවරණය කරමින් වැඩමුළු 20 ක් පවත්වන ලදී
- **බොරැල්ල කලාපය** -
  ජනාවාස 47 ක් ආවරණය කරමින් වැඩමුළු 37 ක් පවත්වන ලදී
- **මැද කොළඹ කලාපය** -
  ජනාවාස 30 ක් ආවරණය කරමින් වැඩමුළු පවත්වන ලදී



*රාජ්‍ය නිලධාරීන් විසින් ප්‍රජාවගේ ගැටලු පිළිබඳ සාකච්ඡා කරමින්*

## 02 ළමා කුසලතා, ආකල්ප ප්‍රවර්ධන වැඩසටහන

### 2.1 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගයන්හි ජයග්‍රාහකයින් වෙනුවෙන් ත්‍යාග, කුසලාන හා සහතිකපත් ප්‍රදානය

2016 ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ ළමා සිතුවම්, ළමා කෙටි නාට්‍ය, ළමා රචනා, සය සාමාජික සැහැල්ලු පන්දු ක්‍රිකට් තරගාවලීන්හි දෙවන, තෙවන ස්ථාන ලබාගත් හා කුසලතා දැක්වූ ළමුන් වෙනුවෙන් තිළිණ, සහතිකපත්, කුසලාන ප්‍රදානය හිටපු ජනාධිපති ගරු ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ ආර්යාව වන හේමා ප්‍රේමදාස මැතිනියගේ ප්‍රධානත්වයෙන් 2017.01.21 වන දින කොළඹ නවනගර ශාලාවේදී උත්සවකාරයෙන් පැවැත්විණි.





*ගරු දිවංගත ජනාධිපති ආර්. ප්‍රේමදාස මැතිතුමාගේ ආර්යාව වන හේමා ප්‍රේමදාස මැතිනිය විසින් ජයග්‍රාහී ළමුන් හට සහතිකපත් ප්‍රදානය කරමින්*

### 2.2 2017 ලෝක ජනාවාස දින වැඩසටහන

*2.2.1 "ස්වශක්ති" ළමා සිතුවම් තරගාවලිය*

නාගරික අඩු පහසුකම් සහිත ජනාවාසයන්හි ජීවත් වන දරු දැරියන්ගේ කලා කුසලතා, හැකියාවන් ඔප් නංවමින්, ළමා වැඩසටහන් රාශියක් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ සමාජ සජීවීකරණ අංශය මඟින් "ස්වශක්ති" මානව සංවර්ධන වැඩසටහන ඔස්සේ සමාජයට එළිදැක්වීමට පියවර ගෙන තිබේ.

2017 ලෝක ජනාවාස දිනය අරමුණ කර ගනිමින් "සර්ලන නිවහනක උරුමය සැමට" යන තේමාව යටතේ හත්වන වරටත් නාගරික දරුදැරියන්ගේ කලා මංගල්‍යයන් එළිදැක්වීමෙහිලා නව මංපෙත් විවර කරන ලදී.

වයස් කාණ්ඩ 6 - 9, 10 - 14, 15 - 18 ඔස්සේ මාතෘකා කාණ්ඩ ගත කරමින් ළමා සිතුවම් තරගාවලිය වයස් කාණ්ඩ 03 කින් ක්‍රියාත්මක කරන ලදී. ඉන් පළමු අදියරේදී ළමා හැකියාවන් මත ළමා සිතුවම් 15,000 කට ආසන්න ප්‍රමාණයක් නිර්මාණය කර ගැනීමට සමත් වූ අතර, එම චිත්‍ර සෞන්දර්ය කලා විශ්ව විද්‍යාලය හා ජයවර්ධනපුර කෝට්ටේ කලාප අධ්‍යාපන කාර්යාලය සම්බන්ධ කර ගනිමින් ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මගින් දෙවන වටය සඳහා කලා හපනුන්ගේ කලාත්මක චිත්‍ර 3,000ක් තෝරා ගන්නා ලදී. එහිදී දෙවන වටයට සුදුසුකම් ලැබූ දරු දැරියන්ගේ කලා දක්ෂතා උකහා ගැනීමට අවස්ථාව සලසමින් අවසන් මහා තරගය විහාර මහා දේවී උද්‍යානයේදී 2017.09.23 වන දින පවත්වන්නට කටයුතු කරන ලදී.

## ළමා සිතුවම් තරගයේ ජයග්‍රාහකයින් (6 - 9 වයස් කාණ්ඩය)

### ප්‍රථම ස්ථානය





ඒ. ඩී. ජනිරු ජයිත් බෝනුක
අංක 157
වේළුවන පාර
දෙමටගොඩ
කොළඹ 10

### දෙවන ස්ථානය





කේ. පී. ඉහන්සා නේත්‍රාංජලී
අංක 1/112
ඉහළගම
ගම්පහ

### තෙවන ස්ථානය





ආර්. වී. සසුලි උ. රූපසිංහ
අංක 1/1
පහළ ඉඹුල්ගොඩ
ඉඹුල්ගොඩ

## ළමා සිතුවම් තරගයේ ජයග්‍රාහකයින් (10 - 14 වයස්

### ප්‍රථම ස්ථානය





ජේ. කේ. යසසි හංසිනා
281/සී
සරණපාලහිමි මාවත
බොරැල්ල

### දෙවන ස්ථානය





එස්. සදීනා ලජානි
29/14
බේස්ලයින් මාවත
දෙමටගොඩ
කොළඹ 09

### තෙවන ස්ථානය





ජේ.කේ. යසිරු රන්සන
281/සී
සරණපාලහිමි මාවත
බොරැල්ල

**ළමා සිතුවම් තරගයේ ජයග්‍රාහකයින්  (15 - 18 වයස්**

**ප්‍රථම ස්ථානය**





**එස්. ඒ. හසිත්තරා මධුෂ්කා**
උඩමත්තල
තිස්සමහාරාමය

**දෙවන ස්ථානය**





**ඩී.සී.ඒ. කුසල් දුලාංජන**
අංක 146
අරුණෝදය මාවත
ඔබේසේකරපුර
රාජගිරිය

**තෙවන ස්ථානය**





**ඩබ්. කේ. ඉසුරි සෙව්වන්දි**
187/10/එන්
නවලෙනවර උයන
හල්තොට
හොරණ

*2.2.1 මාතර ළමා සිතුවම් තරගාවලිය - 2017.09.30 වන දින රුහුණු විශ්වවිද්‍යාලයේ දී*





*මාතර දිස්ත්‍රික්කයේ පාසල්වල සිසු දරුදැරියන් සම්බන්ධ කර ගනිමින් ළමා සිතුවම් තරගාවලිය පවත්වන අයුරු*





*ළමා සිතුවම් ප්‍රදර්ශනය - මාතර පැරණි ලන්දේසි වෙළඳ මධ්‍යස්ථානය*

*2.2.2 "ස්වශක්ති" ළමා කෙටි නාට්‍ය තරගාවලිය*

2010 වසරේ සිට ක්‍රියාත්මක වන මෙම ළමා කෙටි නාට්‍ය උළෙල මගින් දරු දැරියන් විශාල සංඛ්‍යාවකට තම කලා කුසලතාවයන් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් මෙන්ම ඒ සඳහා උචිත වේදිකාවත් නිර්මාණය කර දීමට හැකියාව ලැබුණි.

ඇතැම් අවස්ථාවන්හි පාසල් අධ්‍යාපනයවත් ලැබීමට තරම් වාසනාවක් නොමැති පාසල් යන වයසේ පසුවන දූදරුවන් මෙන්ම සැඟවුණු දක්ෂතා ඇති එහෙත් ඒ සඳහා අවස්ථාවක් නොලද දරුවන් කොළඹ නාගරිකයේ අඩු පහසුකම් සහිත ජනාවාස තුළින් අපට මුණගැසී ඇත. එසේ වී නමුත් ඔවුන් තුළ සැඟවුණු කුසලතාවයන් ඇති බව පසක් කරගත හැකිවුයේ "ස්වශක්ති" ළමා කෙටි නාට්‍ය තරඟාවලිය හේතුවෙනි.

මෙහිදී නාට්‍ය තරඟාවලිය අදියර 02ක් යටතේ ක්‍රියාත්මක කරනු ලැබූ අතර, ප්‍රවීණ විනිශ්චය මණ්ඩලයක් මඟින් පළමු අදියරයන්හි තෝරාගන්නා ලද ප්‍රමිතියෙන් යුතු නාට්‍ය ඊළඟ වටය සඳහා ඉදිරිපත් කෙරේ.

**ළමා කෙටි නාට්‍ය තරගාවලියේ අවසන් අදියර**

දිනය - 2017.09.12

ස්ථානය - මාලිගාවත්ත ප්‍රදීපා ශාලාව

| අ/අ | කලාපය | නාට්‍ය ප්‍රමාණය |
|---|---|---|
| 01 | උතුරු කොළඹ | 08 |
| 02 | මැද කොළඹ | 06 |
| 03 | බොරැල්ල | 03 |
| | නැ / බටහිර කොළඹ | 03 |
| | ***එකතුව*** | *20* |





*ජනාවාස ළමුන් තම රංගන හැකියා එළි දක්වමින්*

**ළමා කෙටි නාට්‍ය තරගාවලියේ ජයග්‍රාහක නාට්‍ය කණ්ඩායම්**



**ප්‍රථම ස්ථානය**

දැඩිමුත්තුඩුව ජනාවාසය

**"කැටේ හොලවපං"** ළමා කෙටි නාට්‍යය



**දෙවන ස්ථානය**

නෙල්සන් පටුමග ජනාවාසය

**"අපේ දැක්ම"** ළමා කෙටි නාට්‍යය



**තෙවන ස්ථානය**

132 පංචිකාවත්ත ජනාවාසය

**“මාකට්ං”** ළමා කෙටි නාට්‍යය

**හොඳම නළුවා**

**හොඳම නිළිය**





**කේ. තරිඳු කුසල්**
“කැටේ හොලවපං”
දැඩිමුත්තුඩුව ජනාවාසය

**පී.කේ. මෙත්තා පඩුවාවල**
“කැටේ හොලවපං”

*2.2.3 ලෝක ජනාවාස දින ජාතික උත්සවය*

ලෝක ජනාවාස දිනට සමගාමීව පැවැත්වූ තරගාවලීන්හි පළමු ස්ථානය ලබාගත් දරුදැරියන් හට ත්‍යාග, සහතිකපත් හා කුසලාන ලබාදීම 2017.10.02 වන සඳු දින මාතර සනත් ජයසූරිය ක්‍රීඩාංගණයේදී උත්සවාකාරයෙන් පැවැත්විණ.



*2.2.4 ළමා නායකත්ව කුසලතා ධනාත්මක ආකල්ප ප්‍රවර්ධනය ක්‍රියාකාරීත්වය ඇතිකරනු වස් ළමා සමිති පිහිටුවීම හා යාවත්කාලීන කිරීම*

ජනාවාස ළමුන්හට තම දක්ෂතා, කුසලතා හා ආකල්ප එළිදැක්වීමේ තෝතැන්නක් ලෙස ළමුන් ඒකරාශී කරගනිමින් පිහිටුවාගන්නා ළමා සමිතිය දැක්විය හැකිය. ඔවුන් තුළ පවත්නා සැඟවුණු දක්ෂතා කරලියට ගෙන එමින් එම ළමුන්ගේ හැකියාවන් සඳහා වටිනාකමක් ලබාදීම ළමා සමිති හරහා සිදු කෙරේ. 2017 වර්ෂය තුළ කොළඹ නාගරික කලාපය තුළ ළමා සමිති 17ක් හා කොළඹින් පිටත ළමා සමිති 06ක් අළුතින් ස්ථාපිත කරන ලදී.



## 2.3 ළමා ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහනක් ක්‍රියාත්මක කිරීම

කුඩා කල සිට ම දරුවන්ට ඉතිරි කිරීමේ පුරුද්ද ඇති කිරීම සඳහා නාගරික ජනාවාස අධිකාරිය මගින් ක්‍රියාත්මක වැඩසටහනක් ලෙස ළමා ඉතුරුම් වැඩසටහන දැක්විය හැකිය. ලංකා බැංකුව හා එක්ව කොළඹ නාගරික කලාපය තුළ මෙන්ම කොළඹින් පිටත මානව සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක නිවාස ව්‍යාපෘතීන්හිද වර්ෂය පුරා ක්‍රියාත්මක මෙම වැඩසටහන මගින් එක් ළමයෙකු සඳහා රු. 100.00 ක දායකත්වයක් අධිකාරිය මගින් දරන අතර, ලංකා බැංකුව මගින් ද එක් දරුවෙකු සඳහා රු. 100.00 ක දායකත්වයක් දරයි. 2017 වර්ෂයේදී ළමුන් 526 දෙනෙකු සඳහා ඉතුරුම් ගිණුම් ආරම්භ කිරීමට කටයුතු කරන ලදී.



ගරු නිවාස, ඉදිකිරීම් හා සංස්කෘතික කටයුතු අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් ළමුන් හට ඉතුරුම් කැට හා ඉතුරුම් පොත් ලබාදෙමින්



ජනාවාස භාර නිලධාරී විසින් ළමුන් හට ඉතුරුම් කැට හා ඉතුරුම් පොත් ලබාදෙමින්

## 2.4 ජනාවාස ළමුන් සඳහා උපකාරක පංති පැවැත්වීම


විවිධ ආර්ථික දුෂ්කරතා හේතුවෙන් පාසල් යාමට හැකියාවක් නොමැති දරුවන් බොහෝමයක් මානව සංවර්ධන වැඩසටහන ක්‍රියාත්මක ජනාවාසයන්හි සිටින අතර, මූලික සාක්ෂරතාවය පවා නොමැති දරුවන් ද මේ අතර සිටී. කිසිවෙකුගේ අවධානයක් නොමැති මෙම ළමුන් වෙනුවෙන් අප අධිකාරියේ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ මැදිහත්වීමෙන් කොළඹ නාගරික කලාපයට අයත් ජනාවාසයන්හි උපකාරක පංති වැඩසටහන ක්‍රියාත්මක කරන අතර, බොහෝමයක් ළමුන් ඊට උනන්දුවෙන් යුතුව සහභාගී වේ.





## 2.5 ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන ආරම්භ කිරීම

අනාගත අභියෝගයන් ජයගැනීම සඳහා න්‍යායාත්මක දැනුම මෙන්ම තාක්ෂණික දැනුමින් ද සන්නද්ධ වීම වත්මන් සමාජය තුළ අනිවාර්යය කරුණකි. එහෙත් එම දැනුම ලබාගැනීමට සමාජය තුළ ඉඩ ප්‍රස්ථාවන් ඉතා සීමිතය. මෙවන් සමාජ වටපිටාවක් තුළ එම ප්‍රතිලාභයන් නොලබන්නා වූ දරුදැරියනට අධිකාරියේ මැදිහත්වීම තුළින් සම්පත් මධ්‍යස්ථාන පිහිටුවීම හරහා පරිගණක තාක්ෂණ දැනුම ජනාවාස දරුවන් වෙත ලබාදීම මෙම වැඩසටහනේ මූලික අරමුණයි. එම කරුණු සැලකිල්ලට ගනිමින් ජනාවාසයන් කිහිපයක ප්‍රජා සම්පත් මධ්‍යස්ථාන පිහිටුවා ඇති අතර, 2017.03.14 වන දින සහස්පුර ප්‍රජා සම්පත් මධ්‍යස්ථානයෙහි කටයුතු නැවත ආරම්භ කරන ලදී.



### 2.6 සංස්කෘතික උත්සවයන් පැවැත්වීම

ළමුන් තුළ සුහදත්වය හා තම සංස්කෘතිය පිළිබඳ හැඟීමක් ඇති කරනු වස් ජනාවාසයන්හි බක්මහ උළෙල ආදී සංස්කෘතික අංගයන් සංවිධානය කරනු ලබයි. මෙහිදී ළමුන් දැඩි සංයමයකින් හා උනන්දුවකින් යුතුව එම උත්සවයන් හා සම්බන්ධ වනු දක්නට ලැබේ.





### 2.7 දන්ත වෛද්‍ය සායන පැවැත්වීම

වර්තමානයේ ප්‍රබල සෞඛ්‍ය ගැටලුවක්ව පවතින ළමුන්ගේ මුඛ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීමේ අරමුණින් දන්ත වෛද්‍ය සායනික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, 2017 වර්ෂය තුළ ළමා දන්ත වෛද්‍ය සායන වැඩසටහන් 16 ක් කොළඹ නාගරිකය තුළ ක්‍රියාත්මක කිරීමට කටයුතු කරන ලදී.



## 03 තරුණ කුසලතා ප්‍රවර්ධන වැඩසටහන්

### 3.1 වෘත්තීය පුහුණු වැඩසටහන් හා රැකියා විරහිත තරුණ තරුණියන් සඳහා රැකියා අවස්ථාවන් ලබාදීමේ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

අධ්‍යාපන කටයුතු අවසන් කර රැකියා අපේක්ෂාවෙන් සිටින ජනාවාස තරුණ තරුණියන් වෘත්තීය පුහුණු පාඨමාලාවන්ට හා රැකියා අවස්ථාවන් සඳහා යොමු කිරීමේ හා දැනුවත් කිරීමේ වැඩමුළුවක් ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය (NAITA) සමඟ ඒකාබද්ධව 2017.02.16 වන දින පැවැත්වූ අතර, ඒ සඳහා ළමුන් 176 දෙනෙකු සහභාගී විය.

මෙම අවස්ථාව සඳහා ජෝන් කීල්ස් ආයතනය, ජේ.කේ. ආයතනය හා ටාජ් හොටෙල් ආයතනයේ නිලධාරී මහතුන් සහභාගී වූ අතර, එම නිලධාරීන් විසින් තම ආයතනයන්හි රැකියා අවස්ථාවන් පිළිබඳ දැනුවත් කිරීම් සිදු කරන ලදී.



*වැඩසටහන සඳහා සම්බන්ධ වූ තරුණ තරුණියන් ලියාපදිංචි කරමින්*



*ආයතනයන්ගෙන් පැමිණි නිලධාරීන් විසින් තරුණ තරුණියන් දැනුවත් කරමින්*

*සිරස මාධ්‍ය ජාලය හා නිවාස හා ඉදිකිරීම් අමාත්‍යංශය එක්ව 2017.03.26 වන දින පානදුර ශ්‍රී සුමංගල විද්‍යාලයේදී පැවති දැනමුතු සායන වැඩසටහන හරහා ජාතික ආධුනිකත්ව හා කාර්මික පුහුණු අධිකාරිය හා එක්ව වෘත්තීය පුහුණුව සඳහා තරුණ තරුණියන් බඳවාගැනිම සිදු කරන ලදී.*

*ඊට අමතරව වර්ෂය පුරා ජනාවාස මට්ටමින් තරුණ තරුණියන් වෘත්තීය පුහුණු පාඨමාලාවන් සඳහා යොමු කිරීම සිදු කරනු ලබයි.*





*නා.ජ.සං. අධිකාරියේ සභාපතිතුමන් විසින් පැමිණ සිටි තරුණ තරුණියන් දැනුවත් කරමින්*

## 3.2 තරුණ තරුණියන් සඳහා රූපලාවන්‍ය පුහුණු වැඩසටහන් පැවැත්වීම

වර්තමාන ආර්ථිකය තුළ කාන්තාවගේ දායකත්වය ඉතා වැදගත් මට්ටමක පවතින තත්ත්වයකදී නාගරික තරුණ තරුණියන් අතර, යහපත් ආර්ථික මට්ටමක් ස්ථාපිත කිරීම මෙන්ම ස්වයං රැකියා නියුක්තිකයෙකු ලෙසත් පුහුණු රැකියා අපේක්ෂිතයෙකු ලෙසත් රූපලාවන්‍ය ක්ෂේත්‍රය තුළින් නාගරික තරුණ තරුණියන්හට ඉදිරි ගමන් මාර්ගයක් ඇති කිරීම වස් නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය හා රන්මලී සැලෝන් සහ ඇකඩමි පෞද්ගලික ආයතනය ඒකාබද්ධව පවත්වනු ලැබූ රූපලාවන්‍ය පුහුණු එක්දින වැඩමුළුව, නාගරික තරුණ තරුණියන් 50 දෙනෙකු සඳහා පුහුණු පාඨමාලා සහතික පත් ලාභීන් බවට පවත්වන්නට අවස්ථාව උදා කරන ලදී.

රූපලාවන්‍ය ක්ෂේත්‍රය තුළ නව මං කරා ගමන් කිරීමට දැනුම හා කුසලතා වැඩිදියුණු කිරීමට මෙම වැඩසටහන පැවැත්වීමට මූලික වූයේ බහුතර ප්‍රජා ඉල්ලීම මත වීම විශේෂත්වයකි. වැඩසටහනෙහි සාර්ථකත්වය ශ්‍රී ලාංකීය ජන මාධ්‍ය හා සමාජ මාධ්‍ය හරහා ඇගයීමට ලක් වූයේ මෙම වැඩසටහනෙහි ඉදිරි පියවරක් සඳහා ද සහතිකපත්ලාභීන්ගේ සිත තුළ අපේක්ෂා මල් පුබුදුවමින්ය.



*ප්‍රායෝගික ක්‍රියාකාරකම් මගින් තරුණ තරුණියන් දැනුවත් කරමින්*

## 3.3 තරුණ සමිති පිහිටුවීම

නාගරික තරුණ ප්‍රජාව ආකල්පයන් හා චර්යාවන් අතින් කඩිනමින් විපර්යාසයන්ට ලක්වන පිරිසකි. එහිදී බහුතරයක් සමාජ විරෝධී ක්‍රියාවන් සඳහා යොමු වනු දක්නට ලැබෙන අතර, ඉන් මුදාගනිමින් ඔවුන්ගේ වටිනා තරුණ ජීවිත සමාජයට එලදායී ලෙස මෙහෙයවීමේ අරමුණින් තරුණ සමිති ජනාවාස මට්ටමින් පිහිටුවීමට කටයුතු කරනු ලබයි. එහිදී නැගෙනහිර/බටහිර කොළඹ කලාපය තුළ තරුණ සමිති පිහිටුවා ඇති අතර, එය යාවත්කාලීන කිරීම ද සිදු කරන ලදී.



# 04 ව්‍යවසායකත්ව හා ස්වයං රැකියා ප්‍රවර්ධන වැඩසටහන

## 4.1 කුඩා කණ්ඩායම් ස්ථාපිත කිරීම

මූල්‍ය විනයක් හා ඉතුරුම් සංස්කෘතියක් බිහිකිරීමට ප්‍රජාව හුරුකරවීම තුළින් කුටුම්භ ආර්ථිකය ගොඩනගා ගැනීම උදෙසා කුඩා කණ්ඩායම් ක්‍රමය ජනාවාස මට්ටමින් ක්‍රියාත්මක කරන අතර, එහිදී ගොඩනැගෙන අරමුදල ප්‍රජාවගේ ජීවන තත්ත්වය උසස් කරලීමේ ආරම්භක පියවර වේ. මෙම කණ්ඩායම් සතිපතා රැස්වී සාකච්ඡා පැවැත්වීම තුළින් තම තමන් මුහුණ දෙන ගැටලු විමර්ශනය කිරීමටත් ඒවාට විසඳුම් සොයාගැනීමටත් ඉතා හොඳ පරිසරයක් නිර්මාණය වන අතර, කුඩා කණ්ඩායම් ක්‍රමය ක්‍රියාත්මක ප්‍රජාව අතර මෙයින් ලබාගත් ප්‍රතිලාභයන් ද බොහෝය. එම අරමුණු සාක්ෂාත් කරගැනීම වෙනුවෙන් කුඩා කණ්ඩායම් 30 ක් පිහිටුවීමට 2017 වර්ෂය තුළ කටයුතු කරන ලදී.





## 4.2 “දිරියට දිරියක්” ස්වයං රැකියා මූල්‍ය සහාය සේවා සැපයීම හා උපකරණ සහාය ලබාදීම

තම පවුලට ආර්ථිකමය වශයෙන් ශක්තියක් ලබා දීම සඳහා කාන්තාවන් බොහෝමයක් ස්වයං රැකියාවන්හි නියුතු වනු ජනාවාසයන් තුළ දක්නට ලැබෙන අතර, එසේ තම පවුලේ ආර්ථිකය නගාසිටුවීම සඳහා කැපවන්නා වූ කාන්තාවන් හට “ස්වශක්ති” කාන්තා සවිය වැඩසටහන යටතේ සහනදායී ගෙවීමේ පදනම මත මහන මැෂින් ලබාදීම හා රු. 20,000/- ක උපරිමයකට යටත්ව ඉතා සහනදායී පොළී ප්‍රතිශතයක් මත ණය මුදලක් ලබාදීම සිදු වේ. 2017 වර්ෂයේදී ස්වයං රැකියාලාභීන් 139 ක් සඳහා ණය ලබාදීමට කටයුතු කළ අතර, ප්‍රතිලාභීන් සඳහා මහන මැෂින් 36 ක් ලබාදීමට කටයුතු කරන ලදී.



*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා විසින් ප්‍රතිලාභීන් වෙත මහන මැෂින් හා මූල්‍ය ණය ලබාදීම*

## 4.3 සුළු ව්‍යවසාය සංවර්ධන වැඩසටහන යටතේ ලබාදුන් අධිවේගී මහන මැෂින්හි පසුවිපරම් කටයුතු



ස්වශක්තියෙන් නැගී සිටින කාන්තාවන් හට අත්වැලක් වෙමින් ඔවුන්ගේ ආර්ථිකය ශක්තිමත්

කිරීමේ අරමුණින් අධිකාරිය විසින් සහනදායී ගෙවීම් පදනම මත ලබාදුන් මහන මැෂින්හි පසුවිපරම් කටයුතු කොළඹ නාගරික කලාපය තුළ මහන මැෂින් ප්‍රතිලාභීන් හා කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ මහන මැෂින් ලබාගත් ප්‍රතිලාභීන් ඉලක්ක කරගනිමින් සිදු විය.

### 4.4 “ස්වශක්ති” දිරියට දිරියක් - ස්වයං රැකියා වෙළඳපොළ

ස්වයං රැකියා ලාභීන් වෙත පුහුණු උපකරණ හා මූල්‍ය සහාය ලබාදීම පමණක් නොව ඔවුන් වෙත වෙළඳපොල හඳුන්වා දීම අරමුණු කරගෙන වර්ෂය තුළ ස්වයං රැකියා වෙළඳපොළක් අප විසින් සංවිධානය කරනු ලබයි. එමෙන්ම රාජ්‍ය හා රාජ්‍ය නොවන ආයතන හා සම්බන්ධීකරණය කරමින් එම ස්වයං රැකියාලාභීන් වෙත වෙළඳපොල හඳුන්වාදීම වැඩසටහන් තුළ සක්‍රීයව සිදු කරනු ලබයි.





## 05 “සැමට සෙවණ” ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතීන් ජනතා අයිතියට පත් කිරීම





අප අධිකාරියේ අධීක්ෂණයෙන් හා සම්පත් දායකත්වයෙන් ඉදිකරන ලද හම්බන්තොට “සාරජයගම” ආදර්ශ ගම්මානය ජනතා අයිතියට පත් කිරීම 2017.03.18 දින ද 2017.04.07 දින හම්බන්තොට “සත්මිතුගම” ආදර්ශ ගම්මානය ජනතා අයිතියට පත් කිරීම ද උත්සවාකාරයෙන් පැවැත්විණි.

# 06 පොදු ප්‍රජා ක්‍රියාකාරී වැඩසටහන්

## 6.1 අක්ෂි පරීක්ෂා කිරීම හා ඇස් කණ්ණාඩි ලබාදීම

2017 වර්ෂය තුළ පවත්වනු ලැබූ සායන 27 කින් තෝරාගනු ලැබූ දෘෂ්‍යාබාධ සහිත අඩු ආදායම්ලාභී ප්‍රතිලාභීන් 6,006 දෙනෙකු සඳහා ඇස් කණ්ණාඩි ලබාදීමට කටයුතු කරන ලදී.





*අඩු ආදායම්ලාභීන් සඳහා ඇස් කණ්ණාඩි ලබාදීම ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍යතුමා අතින් සිදු කරන ලදී*

## 6.2 ප්‍රජා වෛද්‍ය සායනික වැඩසටහන් ක්‍රියාත්මක කිරීම

යහපත් සෞඛ්‍ය තත්ත්වයක් සඳහා මිනිසාගේ ශාරීරික සෞඛ්‍ය, මානසික සෞඛ්‍ය සහ සමාජ යහපැවැත්ම යන කාරණා මූලික වේ.

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය විසින් ලෝක ජනාවාස දිනය සැමරීම වෙනුවෙන් ඌන පහසුකම් සහිත ජනාවාසවල ප්‍රජාවගේ සෞඛ්‍ය තත්ත්වය ඉහළ නැංවීම සඳහා “ස්වශක්ති” මානව සංවර්ධන වැඩසටහන යටතේ විවිධ සායනික වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබයි.

ආයුර්වේද වෛද්‍ය දෙපාර්තමේන්තුව හා දන්ත වෛද්‍ය විද්‍යායතනය ආදී සම්පත්දායක ආයතන මැදිහත්වීමෙන් විවිධ වැඩසටහන් රාශියක් ක්‍රියාත්මක කරන ලදී. එහිදී,

- අක්ෂි සායනික වැඩසටහන්
- දන්ත වෛද්‍ය සායනික හා උපදේශන සේවා
- පවුල් සෞඛ්‍ය හා උපදේශන සේවා

යන වැඩසටහන් ජනාවාස මට්ටමින් ක්‍රියාත්මක කෙරිණි. ඒ සඳහා ඌන පහසුකම් සහිත ජනාවාසවල ජීවත්වන 2,000 කට ආසන්න නාගරික ප්‍රජාව සම්බන්ධ විය.





## 6.3 සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන

2017.01.12 වන දින හම්බන්තොට දිස්ත්‍රික්කයේ ලුණුගම්වෙහෙර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ අඩු ආදායම්ලාභීන් වෙත සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ ප්‍රතිලාභීන් 434 දෙනෙකු සඳහා වැසිකිළි ආධාර ලබාදීමට කටයුතු කරන ලදී.





*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් අඩු ආදායම්ලාභීන් වෙත වැසිකිළි ආධාර ලබාදෙමින්*

*6.3.1 "සනීපාරක්ෂක පහසුකම් ප්‍රවර්ධනය කිරීමේ වැඩසටහන යටතේ වැසිකිළි ආධාර ලබාදුන් ප්‍රතිලාභීන් පිළිබඳ පසුවිපරම් කටයුතු*

මෙහිදී කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ වැසිකිළි ආධාර ලබාදීමේ වැඩසටහන යටතේ ආධාර ලබාගත් ප්‍රතිලාභීන්ගේ ඉදිකිරීම් ප්‍රගතිය සම්බන්ධ පසුවිපරම් කටයුතු අධීක්ෂණය කිරීම සිදු විය. එහිදී එම ආධාර යොදවා සාර්ථකව වැසිකිළි නිම කර ඇති බව නිරීක්ෂණය විය.



## 6.4 ප්‍රජා සමිති වෙත පුටු ලබාදීම

ප්‍රජා සමිති හරහා සිදු කරන ලද ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් ඔවුන් වෙත පුටු ප්‍රදානය කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලබන අතර, ආදර්ශ ගම්මාන නිවාස ව්‍යාපෘතීන් ජනතා අයිතියට පත්කිරීමට සමගාමීව එම නිවාස ව්‍යාපෘතීන්හි පිහිටුවා ඇති ප්‍රජා සමිති වෙත පුටු ප්‍රදානය සිදු කරනු ලබයි. 2017 වර්ෂය තුළ ප්‍රජා සමිති 18ක් සඳහා පුටු 477ක් ලබාදීමට කටයුතු කරන ලදී.




*ගරු නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් ප්‍රජා සමිති සභාපති වෙත පුටු ප්‍රදානය*

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය**

**ආදායම් හා වියදම් ගිණුම**

2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| **ආදායම්** | | Rs. | Rs. |
| පුනරාවර්තන වියදම් ප්‍රදාන | | 90,848,450.00 | 70,384,000.00 |
| භාණ්ඩාගාර ප්‍රදාන-මානව සංවර්ධන වැඩසටහන් | | 20,000,000.00 | 20,000,000.00 |
| පොළී ආදායම් | **13** | 6,991,619.09 | 8,857,410.76 |
| වෙනත් ආදායම් | **14** | 7,523,032.35 | 4,688,362.06 |
| **මුළු ආදායම** | | **125,363,101.44** | **103,929,772.82** |
| **වියදම්** | | | |
| **පරිපාලන වියදම්** | | | |
| වැටුප් හා වේතන | | 53,158,043.28 | 50,267,521.92 |
| අතිකාල ගෙවීම් | | 2,234,178.63 | 3,116,382.68 |
| වෙනත් දීමනා | | 4,507,701.00 | 1,588,955.00 |
| සේවක දිරිදීමනා | | 1,507,500.00 | 1,680,000.00 |
| අධ්‍යක්ෂ මණ්ඩල ගාස්තු | | 1,798,896.00 | 1,042,100.00 |
| ගමන් වියදම් (දේශීය) | | 908,070.51 | 1,169,814.47 |
| ගමන් වියදම් (විදේශීය) | | 155,611.18 | 1,015,966.17 |
| ලිපිද්‍රව්‍ය | | 2,887,560.44 | 1,551,251.12 |
| ඉන්ධන | | 4,525,382.51 | 3,120,221.81 |
| සුබසාධන | | 551,577.94 | 511,424.91 |
| පුවත්පත් | | 50,600.00 | 34,500.00 |
| මුද්දර | | 366,023.00 | 304,346.00 |
| උත්සව වියදම් | | 340,421.70 | 22,994.00 |
| බැංකු ගාස්තු | | 34,770.00 | 16,500.00 |

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| දුරකථන ගාස්තු | | 1,993,049.52 | 1,573,099.20 |
| කාර්යාල කුලී | | 14,386,979.29 | 13,408,774.24 |
| කාර්යාල උපකරණ අලුත්වැඩියා | | 579,058.01 | 430,037.61 |
| මෝටර් රථ අලුත්වැඩියා | | 7,753,788.72 | 4,327,220.42 |
| ගොඩනැගිලි අලුත්වැඩියා | | 52,075.00 | - |
| ලී බඩු හා උපකරණ අලුත්වැඩියා | | 10,240.00 | 20,650.00 |
| ගොඩනැගිලි වැඩිදියුණු කිරීම් | | 693,093.13 | 8,227,826.91 |
| මොටර් රථ රක්ෂණ | | 690,301.58 | 380,378.92 |
| කාර්යාල පිරිසිදු කිරීම් | | 952,766.81 | 852,542.85 |
| පුහුණු වියදම් | | 885,704.61 | 389,755.44 |
| මුද්‍රණ ගාස්තු | | 115,819.07 | 246,608.48 |
| ප්‍රදර්ශන ගාස්තු | | 87,012.00 | - |
| පාරිභෝජන භාණ්ඩ මිලදී ගැනිමී | | 19,702.36 | 13,330.50 |
| ප්‍රචාරණය | | 883,750.00 | 240,529.75 |
| වෙනත් වියදම් (සැපයීම්) | | 47,644.00 | 85,323.00 |
| වෙනත් වියදම් (සේවා) | | 588,995.45 | 154,268.00 |
| විගණන ගාස්තු | | 150,000.00 | - |
| සේවක අර්ථසාධක අරමුදල | | 6,221,568.56 | 9,001,806.39 |
| සේවක භාරකාර අරමුදල | | 1,554,985.61 | 1,350,270.96 |
| ආරක්ෂක වියදම් | | 321,200.00 | 354,000.00 |
| පාරිතෝෂික ගෙවීම් | | 3,335,479.00 | 3,688,523.25 |
| විදුලි ගාස්තු | | 14,641.65 | 23,150.16 |
| ජල ගාස්තු | | 20,751.53 | 34,099.92 |
| වෛද්‍ය වාර්ථා වියදම් ප්‍රතිපූරණය | | 21,718.00 | 21,000.00 |
| ණය වාරික අයකිරීම් කොමිස් වියදම් | | 1,116,690.05 | 1,289,932.35 |
| පරිත්‍යාග | | 397,170.00 | 20,491.73 |
| වෙසක් උත්සව වියදම් | | - | 270,708.50 |

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| නීති ගාස්තු | | 92,461.31 | 199,935.80 |
| සුබසාධක සංගමය | | - | 250,000.00 |
| වෙසක් උත්සව වියදම් | | - | 270,708.50 |
| රීල් සමාගම | | - | 8,050.00 |
| රඳවා ගැනීම් බදු | | 210,454.43 | 311,603.87 |
| අඩමාණ ණය | | 269,349.42 | 260,256.39 |
| ස්ථාවර වත්කම් ක්ෂය | **08** | 3,772,788.07 | 5,830,684.73 |
| මෙහෙයුම් කල්බදු කුලී | | 7,629,751.67 | - |
| | | **127,895,325.04** | **118,706,837.45** |
| **සංවර්ධන වියදම්** | | | |
| ලෝක ජනාවාස දින වැඩසටහන් | | 5,171,083.44 | 4,565,773.16 |
| ප්‍රවාහන වියදම් | | 96,505.00 | 46,680.00 |
| ජනසෙවණ ස්වශක්ති මානව සංවර්ධන වැඩසටහන් | | 7,625,040.60 | 15,239,213.80 |
| හම්බන්තොට සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන | | - | 5,374,842.50 |
| සම්පත් මධ්‍යස්ථාන ඉදිකිරීම් | | - | 1,192,025.21 |
| සයුරුපුර නිවාස සංකීර්ණ නඩත්තු වියදම් | | 2,203,520.09 | 3,415,035.93 |
| හම්බන්තොට ව්‍යාපෘති වියදම් | | 1,965,968.49 | 1,913,426.87 |
| පොළොන්නරු  ව්‍යාපෘති වියදම් | | - | 9,952.00 |
| තුරුළුතුරුගම නිවාස ව්‍යාපෘති නඩත්තු වියදම් | | 249,950.00 | 2,000.00 |
| | | **17,312,067.62** | **31,758,949.47** |
| **මුළු වියදම්** | | **145,207,392.66** | **150,465,786.92** |
| **වර්ෂය සඳහා අතිරික්තය / ඌණතාවය** | | **(19,844,291.22)** | **(46,536,014.10)** |

# නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය


## මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශනය

## 2017 - දෙසැම්බර් - 31 දිනට

| | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| **වත්කම්** | **-** | **Rs.** | **Rs.** |
| **ජංගම වත්කම්** | | | |
| මුදල් හා බැංකු ශේෂය | **01** | 74,251,686.45 | 74,095,000.39 |
| සම්පත් මධ්‍යස්ථාන - තොගය | **02** | 946,098.50 | 1,020,096.50 |
| මුදල් අත්තිකාරම් | **03** | 391,867.82 | 198,481.00 |
| උත්සව අත්තිකාරම් | | 31,250.00 | |
| සේවක නිවාස ණය | | 17,664,245.64 | 20,871,830.38 |
| ආපදා ණය | | 12,835,371.38 | 9,861,351.22 |
| සුභ සාධන ණය | | 10,000.00 | 10,000.00 |
| නා.ස.අ ලැබිය යුතු සේවා ගාස්තු | | 207,331,767.00 | 207,331,767.00 |
| ලැබිය යුතු විසිරි නිවාස ණය 2018 | | 9,070,378.49 | 12,318,429.43 |
| ලැබිය යුතු ගිණුම් | **04** | 64,310,473.50 | 42,597,242.96 |
| ඉදිකිරීම් අත්තිකාරම් | **05** | 2,855,769.83 | 5,502,913.10 |
| | | **389,698,908.61** | **373,807,111.98** |
| **ජංගම නොවන වත්කම්** | | | |
| ණය තොගය | **06** | 418,578,818.72 | 420,512,572.69 |
| කෙරීගෙන යන වැඩ | **07** | 1,370,592,291.49 | 1,241,924,716.52 |
| දේපල,පිරියත හා උපකරණ | **08** | 9,466,352.56 | 13,775,918.25 |
| අඟුලාණ සයුරුපුර නිවාස තොගය | | 112,500,000.00 | 152,685,000.00 |
| හලාවත නිවාස තොගය | | 52,970,619.10 | 52,967,468.10 |
| 48 වත්ත නිවාස තොගය ( නිවාස ඒකක 18) | | 34,500,000.00 | 34,500,000.00 |
| තුරුඉතුරුගම නිවාස තොගය (නිවාස ඒකක 8) | | 6,328,507.81 | 6,328,507.81 |
| | | **2,004,936,589.68** | **1,922,694,183.37** |
| **මුළු වත්කම්** | | **2,394,635,498.29** | **2,296,501,295.35** |

| වගකීම් | සටහන් | 2017 | 2016 |
|---|---|---|---|
| **ජංගම වගකීම්** | | | |
| උපචිත වියදම් | **09** | 53,934,497.40 | 152,962,049.10 |
| කළමනාකරණ සංස්ථා අරමුදල - සයුරුපුර | | 11,823,000.00 | 11,286,000.00 |
| අගුලාණ ජල බිල්පත් එකතු කිරීම් | | 794,291.86 | - |
| රඳවාගැනීම් මුදල් | **10** | 1,299,416.89 | 56,025,567.90 |
| රීල් සමාගම - ගෙවිය යුතු වියදම් | | 7,107,859.84 | - |
| ජාතික නිවාස සංවර්ධන අධිකාරිය | **11** | - | - |
| විසිරි නිවාස ණය - ඉදිරියට ගෙවීම් | | 274,303.72 | 197,754.89 |
| සිංහපුර කුලී - ඉදිරියට ගෙවීම් | | - | 30,000.00 |
| තුරුඉතුරුගම නිවාස ණය - ඉදිරියට ගෙවීම් | | 105,910.00 | - |
| ස්වයං රැකියා ණය - ඉදිරියට ගෙවීම් | | 10,182.83 | |
| හලාවත නිවාස ණය - ඉදිරියට ගෙවීම් | | 461,599.00 | - |
| හම්බන්තොට සනීපාරක්ෂක පහසුකම් වැඩිදියුණු කිරීමේ වැඩසටහන | | 4,514,970.13 | - |
| | | **80,326,031.67** | **220,501,371.89** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| පාරිතෝෂික සඳහා වෙන්කිරීම් | | 16,488,828.50 | 13,403,340.50 |
| | | **16,488,828.50** | **13,403,340.50** |
| **මුළු වගකීම්** | | **96,814,860.17** | **233,904,712.39** |
| **ශුද්ධ වත්කම්** | | **2,297,820,638.12** | **2,062,596,582.96** |
| ස්කන්ධය හා සංචිත | | | |
| භාණ්ඩාගාර ප්‍රදාන | **12** | 2,081,868,530.69 | 1,826,800,184.31 |
| ඒකාබද්ධ අරමුදල | | 12,065,000.00 | 12,065,000.00 |
| අයහාර සංචිත අරමුදල | | 93,094,358.50 | 93,094,358.50 |
| | | **2,187,027,889.19** | **1,931,959,542.81** |
| **ආදායම් වියදම් ශේෂය ඉ/ගේ** | | 130,637,040.15 | 177,173,054.25 |
| වර්ෂයට අදාල ආදායම් (වියදම්) ශේෂය | | (19,844,291.22) | (46,536,014.10) |
| | | **110,792,748.93** | **130,637,040.15** |
| **මුළු ස්කන්ධය** | | **2,297,820,638.12** | **2,062,596,582.96** |


පිටු අංක 03 හා 04 හි දැක්වෙන ගිණුම් ප්‍රතිපත්ති හා පිටු අංක 10 සිට 14 දක්වා දැක්වෙන සටහන් මුල්‍ය ප්‍රකාශ කට්ටලයේ මුලිකාංගයකි. අවසන් මුල්‍ය ප්‍රකාශණ පිළියල කිරීම හා ඉදිරිපත් කිරීම නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ කළමනාකාරණ මණ්ඩලයේ වගකිම වේ. මෙම මුල්‍ය ප්‍රකාශණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය හිමිව තිබෙන අතර ඔවුන් වෙනුවෙන් අත්සන් කරන ලදී.


---------------------

අධ්‍යක්ෂ(මුදල්)
නා.ජ.ස.අ.


---------------------

අධ්‍යක්ෂ ජනරාල්
නා.ජ.ස.අ.


---------------------

සභාපති
නා.ජ.ස.අ.


---------------------

අධ්‍යක්ෂ මණ්ඩල සාමාජික
නා.ජ.ස.අ.

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## මුල්‍ය ප්‍රවාහ ප්‍රකාශනය

## 2017 දෙසැම්බර් 31 දිනට

| | 2017 | 2016 |
|---|---|---|
| | **Rs.** | **Rs.** |
| **මුදල් ප්‍රවාහය - මෙහෙයුම් කටයුතු** | | |
| **ලැබීම්** | | |
| භාණ්ඩාගාර ලැබීම් - පුනරාවර්ථන | 90,848,450.00 | 70,384,000.00 |
| වෙනත් ආදායම් | 369,130.20 | 211,425.04 |
| පොළී ආදායම් | 2,767,857.78 | 3,116,038.44 |
| ආපදා ණය පියවීම් | 8,174,637.34 | 4,525,797.14 |
| නා.ජ.සං.අ. සේවක නිවාස ණය අයකිරීම් | 4,711,045.12 | 4,481,960.05 |
| අඟුලාන වාරික | 407,100.00 | 870,101.00 |
| සිංහපුර කුලී ආදායම් | 431,000.00 | 455,000.00 |
| ටෙණ්ඩර් තැන්පතු | | 298,000.00 |
| ගොඩනැගිලි අළුත්වැඩියා ප්‍රතිපූර්ණය | 1,786,059.20 | |
| රීල් ආදායම් | 7,107,859.84 | |
| ස්ථාවර වත්කම් විකිණීම | 4,067,825.00 | |
| මුදල් අත්තිකාරම් | | 133,462.30 |
| | 120,670,964.48 | 84,475,783.97 |
| **ගෙවීම්** | | |
| වැටුප් හා වෙනත් දීමනා | 70,039,754.54 | 68,863,354.82 |
| අතිකාල හා ගමන් වියදම් | 3,490,190.60 | 2,190,819.54 |
| සැපයුම් හා සේවාවන් | 15,224,893.57 | 8,226,633.65 |
| ගිවිසුම් යටතේ සේවාවන් | 7,314,378.25 | 9,320,967.17 |
| නඩත්තු වියදම් | 5,210,990.91 | 14,937,885.69 |
| ණය එකතු කිරීමේ කොමිස් | 1,051,711.95 | 1,298,762.35 |
| මුදල් අත්තිකාරම් | 179,243.63 | |
| | 102,511,163.45 | 104,838,423.22 |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **18,159,801.03** | **(20,362,639.25)** |

| | 2017 | 2016 |
|---|---|---|
| | **Rs.** | **Rs.** |
| **ආයොජන ක්‍රියාකාරකම්** | | |
| **ලැබීම්** | | |
| විසිරි නිවාස ණය වාරික | 7,913,222.89 | 9,785,535.84 |
| අනුරාධපුර නිවාස වාරික | 398,775.00 | 731,150.00 |
| ස්වශක්ති ණය වාරික | 787,036.74 | 588,988.92 |
| මහන මැෂින් | 596,820.00 | 599,670.00 |
| සහස්පුර නිවාස ව්‍යාපෘතිය | 549,427.64 | 684,740.45 |
| සිංහපුර නිවාස ව්‍යාපාතිය | 937,409.61 | 497,336.82 |
| වදුල්ලවත්ත නිවාස ව්‍යාපෘතිය | 1,192,260.00 | 811,509.60 |
| ශ්‍රී වික්‍රමපුර ආදායම් | | 213,075.00 |
| සනීපාරක්ෂක පහසුකම් සංවර්ධන වැඩසටහන | 4,514,970.13 | |
| විකුණුම් නිවාස මූලික ගෙවීම් | 514,300.00 | |
| හලාවත නිවාස ණය වාරික | 447,299.00 | |
| | 17,851,521.01 | 13,912,006.63 |
| **ගෙවීම්** | | |
| අඟුලාන ව්‍යාපෘතිය | 2,310,874.09 | 5,746,396.88 |
| ලුනාව ව්‍යාපෘතිය | 247,612,412.14 | 229,370,327.00 |
| තලවකැලේ ව්‍යාපෘතිය | (7,071,000.11) | 17,534,996.93 |
| හම්බන්තොට ව්‍යාපෘතිය | 1,965,363.59 | 11,343,532.72 |
| හලාවත ව්‍යාපෘතිය | 3,151.00 | 789,812.00 |
| හොරණ ව්‍යාපෘතිය | 6,314,940.72 | |
| අනුරාධපුර ව්‍යාපෘතිය | 243,200.00 | |
| රජ්ගම ව්‍යාපෘතිය | 52,595,263.00 | |
| මහයියාව ව්‍යාපෘතිය | 997,801.14 | |
| ස්ථාවර වත්කම් මිලදී ගැනීම් | 2,566,555.39 | 3,985,629.89 |
| සමාජ සජීවීකරණ වියදම් | 16,009,094.41 | 22,854,572.55 |
| නා.ජ.සං.අ. සේවක නිවාස ණය | 600,000.00 | 2,400,000.00 |
| ආපදා ණය | 11,436,640.00 | 4,047,675.04 |
| විසිරි නිවාස ණය | | 1,300,000.00 |
| | 335,584,295.37 | 299,372,943.01 |
| | | |
| **ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(317,732,774.36)** | **(285,460,936.38)** |

| | 2017 | 2016 |
|---|---|---|
| | **Rs.** | **Rs.** |
| **මූල්‍ය ක්‍රියාකාරකම්** | | |
| භාණ්ඩාගාර ප්‍රදාන (ප්‍රාග්ධන) | 299,049,179.39 | 233,150,820.62 |
| අඟුලාන කලමනාකරණ සංස්ථා අරමුදල | 680,480.00 | |
| **මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ජනිත වූ ශුද්ධ මුදල් ප්‍රවාහය** | **299,729,659.39** | **233,150,820.62** |
| මුදල් හා මුදල් සමාන දෑ වල ශුද්ධ වැඩිවීම්/ (අඩුවීම්) | 156,686.06 | (72,672,755.01) |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් සමාන දේ | 74,095,000.39 | 146,767,755.40 |
| වර්ෂය අවසානයේ මුදල් හා මුදල් සමාන දේ | **74,251,686.45** | **74,095,000.39** |
| **<u>සටහන - මුදල් ප්‍රවාහ ප්‍රකාශය</u>** | | |
| **31/12/2017 දිනට මුදල් පොතේ ශේෂය** | | |
| ලංකා බැංකුව - බත්තරමුල්ල (පුනරාවර්ථන) ගිණුම | 14,386,618.02 | |
| ලංකා බැංකුව - බත්තරමුල්ල (ප්‍රාග්ධන) ගිණුම | 39,385,571.65 | |
| ලංකා බැංකුව - බත්තරමුල්ල (අනුරාධපුර) ගිණුම | 2,793,659.06 | |
| ඉතිරිකිරීමේ ගිණුම | 5,064,277.56 | |
| කලමනාකරණ සංස්ථා ඉතුරුම් ගිණුම | 12,621,560.16 | |
| | 74,251,686.45 | |

## නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

## ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශය

## 2017/12/31 දිනට

| ගිණුමේ නම | ආරම්භක ශේෂය | | වර්ෂය තුල වෙනස්වීම් | | | | අවසාන ශේෂය (රු.) | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2016 | 2017 | 2016 | | 2017 | | 2016 | 2017 |
| | | | එකතු කිරීම් | අඩු කිරීම් | එකතු කිරීම් | අඩු කිරීම් | | |
| මූලික ප්‍රාග්ධනය | - | - | - | - | - | - | - | - |
| ඒකාබද්ධ අරමුදල් | - | 12,065,000.00 | - | - | - | - | 12,065,000.00 | 12,065,000.00 |
| රජයේ ප්‍රදාන ගිණුම | 1,627,739,363.69 | 1,826,800,184.31 | 12,065,000.00 | - | 295,225,387.96 | 40,157,041.58 | 1,826,800,184.31 | 2,081,868,530.69 |
| අයහාර සංචිත | 93,094,358.50 | 93,094,358.50 | 213,150,820.62 | 14,090,000.00 | - | - | 93,094,358.50 | 93,094,358.50 |
| සමුච්චිත අරමුදල් ගිණුම | 177,173,054.15 | 130,637,040.15 | - | 46,536,014.10 | - | 19,844,291.22 | 130,637,040.15 | 110,792,748.93 |
| **එකතුව** | **1,898,006,776.34** | **2,062,596,582.96** | **225,215,820.62** | **60,626,014.10** | **295,225,387.96** | **60,001,332.80** | **2,062,596,582.96** | **2,297,820,638.12** |

107

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
## கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
## AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්යූඩී/සී/යූඑස්ඩීඒ/එෆ්ඒ/17/01 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 21 දින.

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

යථෝක්ත වාර්තාව මේ සමග එවා ඇත.

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න

විගණකාධිපති (වැඩබලන)

පිටපත් - 1. ලේකම් - නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය

2. ලේකම් - මුදල් හා ජනමාධ්‍ය අමාත්‍යාංශය

URBAN SETTLEMENT DEVELOPMENT AUTHORITY
1508
28 SEP 2018
Chairman Office

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව. - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34 +94-11-2887223 ag@auditorgeneral.gov.lk www.auditorgeneral.gov.lk

# විගණකාධිපති දෙපාර්තමේන්තුව
# கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
# AUDITOR GENERAL'S DEPARTMENT

මගේ අංකය / எனது இல. / My No. } එච්යූඩී/සී/යූඑස්ඩීඒ/එෆ්ඒ/17/01 ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2018 සැප්තැම්බර් 21 දින.

සභාපති

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය

**නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව 1971 අංක 38 දරන මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව**

---

නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතේ 17(2) වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර අධිකාරියේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்தூவ வீதி, பத்தரமுல்லை, இலங்கை.- No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka

+94-11-2887028-34  +94-11-2887223  ag@auditorgeneral.gov.lk  www.auditorgeneral.gov.lk

## 1.3 විගණකගේ වගකීම

උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000–1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ.

## 1.4 මතය ව්‍යාචනය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවල ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයේ හා හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ වාර්තාගත වූ හෝ වාර්තාගත නොවූ හෝ විෂයයන් සහ මූලිකාංගවලට අදාළව කවර හෝ ගැලපීම් කිරීමේ අවශ්‍යතාවයක් තිබුණේදැයි තීරණය කිරීමට මට නොහැකි විය.

## 2. මූල්‍ය ප්‍රකාශන

## 2.1 මතය ව්‍යාචනය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු හේතුවෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් සහ උචිත විගණන සාක්ෂි ලබාගැනීමට මට නොහැකි විය. ඒ හේතුකොට ගෙන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

### 2.2.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 7 හි 69 ඡේදය ප්‍රකාරව, වත්කමක ක්ෂය කිරීම ආරම්භ වන්නේ එය පාවිච්චි කිරීමට සුදානම් තත්ත්වයට ගෙන ආ පසුව වුවද, ඊට අනුකූල නොවන ලෙස මිලදී ගත් දිනය නොසලකා සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරන බව ගිණුම් ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණි.

(ආ) මහා භාණ්ඩාගාරයෙන් ප්‍රාග්ධන වියදම් සඳහා අධිකාරිය වෙත වාර්ෂිකව ප්‍රදානය කරනු ලබන රජයේ ප්‍රදාන ගිණුම්ගත කිරීම සම්බන්ධව අනුගමනය කරනු ලබන ගිණුම් ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල අනාවරණය කර නොතිබුණි.

(ඈ) ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ අධිකාරිය විසින් දේපළ පිරියත හා උපකරණ සරල මාර්ග ක්‍රමය අනුව, ක්ෂය කරන බව දක්වා තිබුණද සමාලෝචිත වර්ෂය අවසානය වන විට පැවති පිරිවැය රු.52,345,094 ක වත්කම් ලියාහල අගයට (WDV) ක්ෂය කර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ ක්ෂය රු.10,354,455 කින් ඌන ගණනය වී තිබුණි.

(ඇ) අධිකාරිය විසින් ජංගම නොවන වත්කම් වසර 05 කට වරක් ප්‍රත්‍යාගණනය කරන බව ගිණුම්කරණ ප්‍රතිපත්ති යටතේ දක්වා තිබුණද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට වසර 05 ඉක්ම වූ කිසිදු වත්කමක් ප්‍රත්‍යාගණනය කර නොතිබුණි.

### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අහුලාන හා හලාවත නිවාස ව්‍යාපෘතිය සඳහා රු.9,653,072 ක් ගෙවා අධිකාරිය විසින් අත්පත් කර ගෙන තිබූ ඉඩම් හෙක්ටයාර් 2.43 ක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉඩම් යටතේ දැක්වීම වෙනුවට කෙරීගෙන යන වැඩ යටතේ දක්වා තිබුණි.

(ආ) අධිකාරිය විසින් විකුණුම් පදනම මත බැහැර කිරීමට අපේක්ෂිත නිවාස යෝජනා ක්‍රම 04 කට අයත් රු.206,299,127 ක් වටිනා නිවාස 124 ක් ජංගම වත්කම් යටතේ තොග ලෙස දැක්වීම වෙනුවට ජංගම නොවන වත්කම් යටතේ නිවාස ව්‍යාපෘති ලෙස දක්වා තිබුණි.

(ඇ) අනුරාධපුර තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතිය ඉදිකිරීමට රේඛීය අමාත්‍යාංශයෙන් ඉකුත් වර්ෂයේදී අධිකාරියට ලැබී තිබුණු රු.58,594,358 ක් ප්‍රදාන යටතේ ගිණුම්ගත කිරීම වෙනුවට ආදායම් සංචිත යටතේ දක්වා තිබුණි.

(ඈ) නැවත අයකර ගැනීමේ පදනම මත නිලධාරීන්ගේ අධ්‍යාපන කටයුතු සඳහා ලබා දී තිබූ ණය මුදල රු.383,625 ක් වියදම් ලෙස ගිණුම් ගතකර තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේදී ආපසු ලැබී තිබූ ණය වාරික වටිනාකම් රු.164,061 ක් පුහුණු වියදමෙන් අඩුකර දක්වා තිබුණි. ඒ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පුහුණු වියදම රු.164,061 කින් අඩුවෙන් දක්වා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයේදී ලැබිය යුතු රු.159,403 ක ණය ශේෂයද මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.

(ඉ) නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයට අයත්ව තිබුණු ජීප් රථයක් 2016 දෙසැම්බර් 21 දින අධිකාරිය වෙත පවරාගෙන තිබුණ ද එය තක්සේරු කර ස්ථාවර වත්කම් යටතේ ගිණුම් ගතකර නොතිබුණි.

(ඊ) අනුරාධපුර "තුරුඉතුරුගම හරිත ජනාවාස ව්‍යාපෘතියෙහි" නිවාස 99 ක් 2013 වර්ෂයේදී නිවාසලාභීන් වෙත ලබාදී තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විට නිවාස 32 ක නිවාසලාභීන්ගෙන් ලැබිය යුතු වාරික ආදායම හඳුනාගෙන ගිණුම් ගතකර නොතිබුණි.

(උ) සමාලෝචිත වර්ෂය අවසානයට වසර 1 ත් වසර 3 ත් අතර අයනොවී පවතින රු.36,731,157 ක ණය ශේෂයක් පැවතියද එම ණය සමාලෝචනය කර ප්‍රමාණවත් පරිදි අඩමාණ ණය වෙන්කිරීම් සිදුකර නොතිබුණි.

(ඌ) සමාලෝචිත වර්ෂයේදී නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබී තිබූ නිවාස ක්‍රම 03 කින් රු.මිලියන 2.67 ක ණය රු.2,670,000 ක වාරික අයකර ගිණුම් ගතකර තිබුණද එම වත්කම්වල වටිනාකම හඳුනාගෙන ගිණුම් ගතකිරීමට කටයුතුකර නොතිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම්

නාගරික සංවර්ධන අධිකාරියෙන් ලැබිය යුතු ලෙස 2017 දෙසැම්බර් 31 දිනට ජංගම වත්කම් යටතේ රු.207,331,767 ක් දක්වා තිබුණද ශේෂ සනාථන විගණනයට ඉදිරිපත් නොවීම හේතුවෙන් එම වටිනාකම සතුටුදායක ලෙස සනාථ කිරීමට හෝ පිළිගැනීමට නොහැකි වූ අතර නාගරික සංවර්ධන අධිකාරියේ 2016 විගණිත මූල්‍ය ප්‍රකාශන අනුවද එවැනි ශේෂයක් ගෙවිය යුතු ලෙස දක්වා නොතිබුණි.

### 2.2.4 පැහැදිලි නොකළ වෙනස්කම්

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය ප්‍රකාශන අනුව, අය විය යුතු ආපදා ණය ශේෂය රු.12,835,371 ක් වුවද උපලේඛන අනුව එම වටිනාකම රු. 12,879,234 ක් වුයෙන් රු.43,863 ක පැහැදිලි නොකල වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විසිරි නිවාස ණය වැඩසටහනෙහි පළමු අදියර යටතේ ලැබිය යුතු ණය වාරික වටිනාකම රු.23,986,390 ක් වූ අතර එයින් වසර 1 ත් වසර 2 ත් අතර ශේෂය රු.14,711,505 ක් ද වසර 2 ට වැඩි ශේෂය රු. 9,274,885 ක් ද විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාලව අයවිය යුතුව පවතින අහුලාන නිවාස කුලී ආදායම රු.10,909,488 ක් වුවද වර්ෂය තුළදී අයකර ගත් කුලී ආදායම රු.407,100 ක් වූයෙන් මුළු කුලී ආදායමෙන් සියයට 96 ක් අයවිය යුතුව පැවතුණි.

(ඇ) තුරුඉතුරුගම නිවාස ව්‍යාපෘතියේ විකුණුම් පදනම මත ලබා දුන් නිවාස 25 ක් සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.672,939 ක් අයවිය යුතු වුවද රු.125,225 ක් පමණක් අයවී තිබූ අතර අයවී නොතිබූ වාරිකවල වටිනාකම සියයට 81 ක් විය. එමෙන්ම, පුනස්ථාපන පදනම මත ලබාදුන් නිවාස 72 ක් සඳහා රු.1,135,512 ක් අයවිය යුතු වුවද රු.167,640 ක් පමණක් අයවී තිබූ අතර සියයට 86 ක ණය ශේෂයක් අයවී නොතිබුණි.

(ඈ) නාගරික සංවර්ධන අධිකාරියේ එකඟතාවයකින් තොරව අධිකාරියේ කළමනාකරණ තිරණයක් මත නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතු කාර්යාල කුලිය ගෙවීම අත්හිටුවා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ගෙවිය යුතු කුලිය රු.21,129,684 ක් විය.

(ඉ) සමාලෝචිත වර්ෂය අවසානය වනවිට අධිකාරිය විසින් ප්‍රජා මූල සමිති වෙත ගෙවිය යුතු රු.11,823,000 ක් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂය අවසානයට අය නොවී පවතින හිඟ ආපදා ණය ශේෂය රු.385,739 ක් වූ අතර ඉන් වර්ෂ 01 ත් 05 ත් අතර වටිනාකම රු.250,379 ක් විය.

(උ) සිංහපුර නිවාස ව්‍යාපෘතියේ සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ කුලී ආදායම රු.1,557,000 ක් වූ අතර ඉන් වර්ෂ 02 ත් 05 ත් අතර අයනොවී පැවති ශේෂය රු.707,000 ක් හෙවත් මුළු කුලී ආදායමෙන් සියයට 45 ක් විය.

(ඌ) සමාලෝචිත වර්ෂය අවසානයට පැවති රඳවාගැනීම් (Retention) මුදල්වල එකතුව රු.1,299,416 ක් වූ අතර ඉන් වර්ෂ 1 ත් 5 ත් අතර පැවති ශේෂය රු.1,106,284 ක් වර්ෂ 5 ඉක්ම වූ ශේෂය රු.110,561 ක් වූ අතර එම ශේෂ නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

## 2.4 නීති රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම් |
| --- | --- |
| (අ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරිය පනත | (i) නාගරික ජනාවාස සංවර්ධනයට අදාල ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම සඳහා සහ එම ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කරන බවට සහතික වීම සඳහා අධිකාරිය ස්ථාපනය කර තිබූ නමුත් අධිකාරිය පිහිටුවා වර්ෂ 9 ක් ගතවී තිබුණ ද ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීමට හා ක්‍රියාත්මක කිරීමට අපොහොසත් වී තිබුණි. |
| | (ii) පනතේ 10 වන වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් සභාපතිවරයකු ඇතුළත් සාමාජිකයන් 14 දෙනෙකුට වැඩි නොවන උපදේශක කමිටුවක් 2017 අප්‍රේල් වනවිට පත් කර තිබුණද පනතේ ප්‍රකාරව එම කමිටුව විසින් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරියේ යෝජනා, සැලසුම්, ව්‍යාපෘති සහ ක්‍රියාකාරී සැලසුම් යනාදී අධිකාරියේ අරමුණු වලට අදාල කාර්යයන් හඳුනාගෙන නොතිබුණි. |
| | (iii) පනතේ 16 (3) උපවගන්තිය ප්‍රකාරව අධිකාරියේ ආරම්භක ප්‍රාග්ධනය රු.මිලියන 5,000 ක් විය යුතු අතර එය කොටස් වශයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලින් ලැබිය යුතු වුවද 2017 වර්ෂය අවසානය වන විටත් අධිකාරියට කිසිදු ප්‍රාග්ධනයක් ඒකාබද්ධ අරමුදලින් ලබාදී නොතිබුණි. |

| | |
|---|---|
| (ආ) 1982 අංක 45 දරන බද්ධ නිවාස අයිතිවාසිකම් (සංශෝධන) පනත 20 (ඌ) උප වගන්තිය | අභූලාන නිවාස ව්‍යාපෘතිය ජනතා අයිතියට පැවරීමට සමගාමීව නිවාස ව්‍යාපෘතියේ කළමනාකරණ කටයුතු සඳහා කළමනාකරණ කමිටු පිහිටුවිය යුතු වුවත් මෙම වාර්තාවේ දින වන විටත් එම කමිටු පිහිටුවීමට කටයුතු කර, නොතිබුණි. මෙම කළමනාකරණ කමිටු පිහිටුවීම වෙනුවෙන් නිවාසලාභීන්ගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට රු.12,621,560 ක් අයකර අධිකාරියේ ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කර තිබූ නමුත් එම කමිටු පිහිටුවීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිවාස ව්‍යාපෘතියේ නඩත්තු වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,203,520 ක් අධිකාරියේ අරමුදලින් දැරීමට සිදු වී තිබුණි. |
| (ඇ) 2015 ජූලි 14 දිනැති අංක 03/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | (i) තත්කාර්ය අතුරු අග්‍රිමයක් ලබා ගන්නා නිලධාරියා විසින් එම කාර්ය නිම කළ විගසම අග්‍රිමය පියවිය යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේ ජනවාරි සිට ජූලි දක්වා වූ කාලය තුළ නිලධාරීන් දෙදෙනෙකු වෙත අවස්ථා 4 කදී ලබා දී තිබූ රු.385,000 ක අතුරු අග්‍රිම මෙම වාර්තාවේ දින වන විටත් පියවා නොතිබූ අතර අවස්ථා 23 කදී නිලධාරීන් 15 දෙනෙකු වෙත ලබාදී තිබූ රු.641,180 ක අතුරු අග්‍රිම පියවීමට දින 27 සිට දින 103 ක් දක්වා වූ කාලයක් ගත වී තිබුණි. |
| | (ii) මාණ්ඩලික තත්ත්වයේ නිලධාරීන්ට පමණක් රු.100,000 ක උපරිමයක් දක්වා තත්කාර්ය අතුරු අග්‍රිම ලබාදිය හැකි අතර එම සීමාවන් ඉක්මවීමට අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා මහා භාණ්ඩාගාරයේ පූර්ව අවසරය ලබාගත යුතුය. එහෙත්, ඊට අනුකූල නොවන ලෙස සමාලෝචිත |

7

| | | |
|---|---|---|
| | | වර්ෂය තුළ මාණ්ඩලික නොවන නිලධාරියෙකු වෙත අවස්ථා දෙකකදී රු.350,000 ක අත්තිකාරම් ලබාදී තිබුණි. |
| (ඇ) | 2017 දෙසැම්බර් 11 දිනැති අංක 03/2017 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව මහා භාණ්ඩාගාරයේ එකඟතාවයකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය මත පමණක් සේවකයකු වෙනුවෙන් රු.15,000 බැගින් සමාලෝචිත වර්ෂය සඳහා රු.1,507,500 ක දිරි දීමනා ගෙවා තිබුණි. |
| (ඉ) | 2015 මැයි 25 දිනැති අංක පීඊඩී/1/2015 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 3.2 වගන්තිය | රාජකාරී කටයුතු ඉටු කිරීම සඳහා මාසික ඉන්ධන දීමනාව ප්‍රමාණවත් නොවන විශේෂ අවස්ථාවන්හිදී, නිසි අනුමැතීන් ලබා ගැනීමෙන් අනතුරුව දරන ලද සත්‍ය ඉන්ධන වියදම ප්‍රතිපූරණය කළ හැකි වුවද, එකී අනුමැතීන් ලබා ගැනීමට ප්‍රථම, අතිරේක ඉන්ධන භාවිතා කර එම මාසය අවසානයේදී අදාල අනුමැතීන් සඳහා යොමු කර තිබුණි. |
| (ඊ) | 2015 ජුලි 10 දිනැති අංක 02/2015 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 10 වන වගන්තිය | අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේදී අපහරණය කරන ලද භාණ්ඩවලට අදාලව ලැබී තිබූ රු.3,985,025 ක් චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව, ඒකාබද්ධ අරමුදලට බැර කර නොතිබුණි. තවද අපහරණ කටයුතු නිම කිරීමෙන් අනතුරුව ඉදිරිපත් කළයුතු සවිස්තරාත්මක වාර්තාව විගණකාධිපති පිටපතක් සහිතව මහා භාණ්ඩාගාරයේ අදාළ අංශ වෙත යොමු කර නොතිබුණි. |

3. මූල්‍ය සමාලෝචනය

3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අධිකාරියේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.19,844,291 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.46,536,014 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ ඌනතාවය රු.26,691,723 කින් අඩුවී තිබුණි. අයභාර වියදම් සඳහා වූ රජයේ ප්‍රදාන රු.20,464,450 කින් වැඩිවීම ඉහත ඌනතාවය අඩුවීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 4 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරිමේදී 2013,2014 වර්ෂවලදී පිළිවෙලින් රු.6,032,874 ක අතිරික්තයක් හා රු.10,284,600 ක ඌනතාවයක් ඇති වී තිබූ අතර 2015 වර්ෂයේදී රු.207,344,767 ක අතිරික්තයක් ඇති වී තිබුණි. එහෙත්, 2016 හා සමාලෝචිත වර්ෂයේදී ඌනතාවයක් ඇති වී තිබූ අතර එය රු.46,536,014 සිට රු.19,844,291 ක් දක්වා අඩු වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික, රජයට ගෙවූ බදු හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැලපීමේදී, 2013 වර්ෂයේදී රු.53,501,687 ක් වූ අධිකාරියේ දායකත්වය සමාලෝචිත වර්ෂය දක්වාම ධන අගයක් ගෙන තිබූ නමුත් එය වාර්ෂිකව උච්චාවචනය වී තිබූ අතර සමාලෝචිත වර්ෂයේදී රු. 53,058,777 ක් වී තිබුණි.

4. මෙහෙයුම් සමාලෝචනය

4.1 කාර්යසාධනය

4.1.1 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2003 ජූනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1.2 ඡේදය අනුව ආයතනයේ වර්තමානයේ පවතින සම්පත්, පසුගිය වසර තුනක මෙහෙයුම් ප්‍රතිඵලවල සමාලෝචනයක් ඒ ඒ කාර්යන් සඳහා වගකීම පැවරී ඇති නිලධාරීන් යනාදී තොරතුරු ඇතුළත් කර සංයුක්ත සැලැස්ම පිළියෙල කර නොතිබුණි.

9

(ආ) 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරි පනතට අනුව අධිකාරියේ අරමුණු ඉටුකර ගැනීම සඳහා ඉටු කළ යුතු පහත සඳහන් කාර්යයන් සංයුක්ත සැලැස්මට ඇතුළත් කර නොතිබුණි.

(i) රජය හා පළාත් පාලන ආයතන සතු ඉඩම් අධිකාරියේ කටයුතු වෙනුවෙන් අත්පත් කර ගැනීම.

(ii) නාගරික ජනාවාසවල ජීවන තත්ත්වය නගා සිටුවීමට අදාල යෝජනා, සැලසුම් හා ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

(iii) නාගරික පදිංචිකරුවන්ගේ ආර්ථික හා සමාජීය තත්ත්වය හඳුනාගැනීමට අදාල වන සමීක්ෂණ හා අධ්‍යනය කටයුතු පැවැත්වීම.

(iv) ජාතික වශයෙන් අදාලවන නාගරික නිවාස ණය යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම.

(ඇ) සමාලෝචිත වර්ෂයට අදාල ක්‍රියාකාරී සැලසුම තුළ ඇතුළත් ක්‍රියාකාරකම්වලින් ඉටුකර ගත යුතු ප්‍රමාණයන්, ඒ ඒ කාර්යයන් සඳහා වගකීම පැවරී ඇති නිළධාරීන් සහ කාර්යසාධන ඇගයීම සඳහා වන දර්ශකයන් (Indicators) ඉදිරිපත් කර නොතිබුණු අතර භාණ්ඩාගාර ප්‍රදාන මත ඉටුකළ යුතු ක්‍රියාකාරකම් පමණක් ක්‍රියාකාරී සැලැස්මට ඇතුළත් කර තිබුණි.

### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

------------------------------

තිරසාර නාගරික ජනාවාස සංවර්ධනයක් ඇති වන බවට සහතික වීම පිණිස දැනට පවතින නිවාස ඒකක වැඩි දියුණු කිරීම මගින් හෝ වඩාත් පහසු නිවාස පහසුකම් හා අවම නාගරික පහසුකම් සඳහා සුදුසු ප්‍රදේශය සැලසීම මගින් සේවා පහසුකම් අඩු නාගරික ජනාවාසවල වෙසෙන තැනැත්තන්ගේ ජීවන තත්ත්වය නගා සිටුවීම 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ ප්‍රධාන අරමුණු වේ.

අධිකාරියේ අරමුණු ඉටු කර ගැනීම සහ ක්‍රියාකාරීත්වය සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ලුනාව නිවාස ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂයේදී රු. මිලියන 90 ක් වැයකොට සම්පූර්ණයෙන්ම නිම කිරීමට සැළසුම් කර සමාලෝචිත වර්ෂය අවසාන වන විට

රු. මිලියන 60 ක් පමණක් වැයකර තිබූ අතර ව්‍යාපෘතියේ කටයුතු සම්පූර්ණයෙන්ම නිමකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂයේදී හොරණ නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් රු. මිලියන 34 ක් වැය කොට සියයට 75 ක වැඩ නිම කිරීමට සැළසුම් කර තිබුණ ද රු.මිලියන 6.29 ක් පමණක් වැයකර තිබූ අතර ලබා කරගත් භෞතික ප්‍රගතිය සියයට 12 ක් විය. තවද, මෙම ව්‍යාපෘතියේ කටයුතුවලදී සිදුව තිබූ රු.668,200 ක පමණ මූල්‍ය අක්‍රමිකතා හේතුවෙන් ව්‍යාපෘතියේ ඉදිරි කටයුතු රේඛීය අමාත්‍යාංශය වෙත පවරාගෙන තිබූ අතර සිදුවූ අක්‍රමිකතා සම්බන්ධයෙන් වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට 2018 ජුනි වන විටත් කටයුතු කර නොතිබුණි.

(ඇ) ගාල්ල, රජගම නාගරික නිවාස ව්‍යාපෘතිය යටතේ පවුල් 137 ක නිවාස සංවර්ධනය කිරීමේ වැඩසටහනෙන් සමාලෝචිත වර්ෂය තුළ රු. මිලියන 63.20 ක් වැයකොට සියයට 95 ක් නිම කිරීමට සැළසුම්කර තිබුණද ලබා කරගත් භෞතික ප්‍රගතිය සියයට 83 ක් වූ අතර ඒ වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී දරන ලද වියදම රු. මිලියන 52.65 ක් විය.

(ඈ) අඟුලාන සයුරුපුර නිවාස ව්‍යාපෘතියේ වෙළඳ සංකීර්ණය සහ කසළ බැහැරකරන ස්ථානය ඉදිකිරීම සඳහා වූ රු.මිලියන 17.21 ක්වූ කොන්ත්‍රාත්තුවේ ගිවිසුම්ගත කාලය 2016 සැප්තැම්බර් 27 දින වන විට අවසන්ව තිබූ නමුත් 2018 ජුනි වන විටත් ව්‍යාපෘතියේ කටයුතු අවසන් කිරීමට හෝ ව්‍යාපෘති කාලය දීර්ඝ කිරීමට කටයුතු කර නොතිබුණි. එමෙන්ම මුල් ප්‍රමාණ පත්‍රයේ ඇතුළත්ව තිබූ රු.මිලියන 2.82 ක කසළ බැහැර කරන ස්ථානයක් ඉදිකිරීමේ ව්‍යාපෘතිය, ප්‍රමාණ පත්‍ර නැවත සංශෝධනයකදී ඉවත් කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය. තවද, ප්‍රමාණ පත්‍ර සංශෝධනයක් හා කොන්ත්‍රාත් වටිනාකම රු.මිලියන 18.77 දක්වා වැඩි වී තිබුණද කොන්ත්‍රාත්කරු සමග නව ගිවිසුමකට එළඹීමටද අධිකාරිය කටයුතු කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

-------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් ඉදිකරන ලද හා ඉදිකරමින් පවතින නිවාස යෝජනා ක්‍රම 05 ක පවතින නිවාස ඒකක 863 කට අදාල හෙක්ටයාර 12.32 ක ඉඩම් විවිධ ආයතනවලින් පවරා ගැනීමට 2011 වර්ෂයේ සිට කටයුතු කර තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම ඉඩම් පවරා ගැනීමට අපොහොසත්ව තිබුණි. එම හේතුවෙන්

නිවාසලාභීන්ට ඉඩම් ඔප්පු ලබාදීමේ ප්‍රමාදයන් සිදුවී තිබූ බව විගණනයේදී වැඩි දුරටත් නිරීක්ෂණය විය.

(ආ) අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය අවසානයට භාණ්ඩාගාර ප්‍රදාන මගින් රු.මිලියන 1,172 ක් වැයකර ලුනාව නිවාස යෝජනා ක්‍රමය වෙනුවෙන් නිවාස ඒකක 380 ක් ඉදිකර තිබුණද 2012 මාර්තු 22 දින විෂයභාර අමාත්‍යවරයා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයේ 3 වන වගන්තිය පරිදි එම නිවාස වල පදිංචි කිරීමට මොරටුව මහ නගර සභා සීමාවේ පදිංචි අඩු පහසුකම් නාගරික ජනාවාස පවුල් 356 ක් හඳුනාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඇ) නාගරික අඩු ආදායම්ලාභී ප්‍රජාව සඳහා වැසිකිළි සාදා නිම කිරීමට එක් වැසිකිළියකට රු. 17,189 ක ද්‍රව්‍යමය ආධාර සහ රු.10,000 ක මූල්‍යමය ආධාර වශයෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු. මිලියන 17.50 ක් වැයකර තිබුණි. වැසිකිළි ඉදිකිරීම් සඳහා හම්බන්තොට දිස්ත්‍රික්කයේ පවුල් 814 ක් පමණක් තෝරා ගෙන තිබූ නමුත් එම දිස්ත්‍රික්කය තෝරා ගත් පදනම විගණනයේදී අනාවරණය නොවුණි. තවද, අධිකාරිය හා ප්‍රතිලාභීන් අතර වූ ගිවිසුම අනුව, මාසයක් තුළ වැසිකිළිය සාදා නිම කළ යුතු අතර එලෙස වැසිකිළි සම්පූර්ණයෙන්ම නිමවා නොමැති පවුල් 380 ක් සම්බන්ධයෙන් අධිකාරිය කිසිදු ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරියේ සේවයෙන් ඉවත් වූ නිලධාරීන් තිදෙනෙකුගෙන් අයවිය යුතු රු.1,059,513 ක ණය අයකර ගැනීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඉ) 2015 වර්ෂයේ සිට බැංකු සැසඳුම් ප්‍රකාශනයක දක්වා තිබූ රු.116,500 ක බැරකම් 02 ක් හඳුනාගෙන ගිණුම්ගත කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ගිවිසුමකට එළඹීමකින් තොරව අධ්‍යයන කටයුතු සඳහා නිලධාරියෙකුට රු.256,000 ක ණය මුදලක් ලබා දී තිබුණි.

(උ) 2014 සැප්තැම්බර් 30 දිනැති අංක 14/1293/517/031 දරන අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව අධිකාරිය පිහිට වූ වහාම සීමාසහිත රීල් එස්ටේට් එක්ස්චේන්ජ් (පුද්ගලික) සමාගම මාස දෙකක් ඇතුළත ඈවර කර එම සමාගමේ වත්කම් හා වගකීම් අධිකාරිය වෙත පවරා ගතයුතු බව දන්වා තිබුණි. එහෙත් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් රු.7,929,972 ක මෝටර් වාහන 5 ක් පමණක් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබූ අතර එදිනට ඉතිරිව පැවති රු.12,499,801 ක වත්කම් හා රු.16,038,231 ක

වගකීම් සහ රු.3,880,025 ක බැංකු ශේෂ කිසිවක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් අධිකාරිය වෙත පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි. තවද, 2015 ඔක්තෝබර් 12 දින සමාගමේ බාහිර පාර්ශවකරුවන් 26 දෙනෙකු වෙනුවෙන් ගෙවීම සඳහා නාගරික සංවර්ධන අධිකාරියෙන් ලබාදී තිබූ රු.19,024,421 කින් 2015 ඔක්තෝබර් මාසයේදී බාහිර පාර්ශවකරුවන් 24 දෙනෙකු වෙත ගෙවීම සඳහා අධිකාරිය විසින් නිකුත් කල රු.7,139,255 ක චෙක්පත් සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් වසර 2 කට අධික කාලයක සිට පාර්ශවකරුවන් වෙත ලබාදීමට කටයුතු කර නොතිබුණි

(ඌ) 2015 ජුනි 12 දිනැති අංක 03/2015/01 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව, හලාවත නිවාස ව්‍යාපෘතියෙහි නිවාසලාභීන්ගෙන් එක් නිවසකට රු.915,148 ක් බැගින් අයකර ගැනීමට තීරණය කර තිබුණි. එහෙත් එම නිවාසවල ඉදිකිරීමේ ප්‍රමිතිය පහළ තත්ත්වයක පැවතීම මත 2017 දෙසැම්බර් 18 දිනැති අංක 11/2017/24 දරන අධ්‍යක්ෂ මණ්ඩල තීරණය අනුව එක් නිවසකින් අය කරන මුදල රු.700,000 ක් දක්වා අඩුකර තිබූ අතර ඒ අනුව අධිකාරියට සිදුවූ පාඩුව රු.12,263,436 ක් විය. තවද, මෙම නිවාස ව්‍යාපෘතියෙහි නිවාස 57 ක් නිවාසලාභීන්ට ලබා දීමට පෙර නිවාස තක්සේරු දෙපාර්තමේන්තුව මගින් තක්සේරු කරගෙන නොතිබුණි.

(එ) භාණ්ඩාගාර ප්‍රතිපාදන මත ඉදිකර තිබූ අඟුලාන නිවාස ව්‍යාපෘතිය සඳහා වැයකර තිබූ රු.1,179,062,714 ක් අතුරින් 2015 වර්ෂයේදී ලාභයට එරෙහිව රු.700,074,056 ක් විධිමත් ක්‍රමවේදයක් අනුගමනය කිරීමකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණ මත කපා හැරීම සිදුකර තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

--------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) විසිරි ණය වැඩසටහන යටතේ ණය එකතු කිරීම දිරිගැන්වීම සඳහා සියයට 10 ක කොමිස් මුදල් ලෙස සමාලෝචිත වර්ෂයේදී රු.1,051,711 ක් අධිකාරිය විසින් ණය එකතු කරන්නන්ට ගෙවා තිබුණ ද අඟුලාන නිවාස ණය සහ දිරිය නිවාස ණය පළමු අදියර වැඩසටහන්හි ණය අයකර ගැනීමේ ප්‍රගතිය පිළිවෙළින් සියයට 4 ක සහ සියයට 45 ක පහළ අගයක් ගෙන තිබුණි.

13

(ආ) අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී අනුරාධපුර "තුරුඉතුරුගම" හා හලාවත නිවාස ව්‍යාපෘති යටතේ නිවාස ලබාදී තිබූ නිවාසලාභීන් 59 දෙනෙකු සමඟ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් විකුණුම් ගිවිසුම්වලට එළඹ නොතිබුණි.

### 4.4 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

-----------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය විසින් අඟුලාන නිවාස ක්‍රමයට අයත් රු.මිලියන 25.60 ක් වටිනා නිවාස ඒකක 08 ක් සමාලෝචිත වර්ෂයේදී මුදල් අයකිරීමකින් තොරව නිදහස් දීමනා පත්‍රයක් මගින් බැහැර කර තිබුණද ඒ වෙනුවෙන් මහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය අවසානයට හම්බන්තොට නිවාස ව්‍යාපෘතිය වෙනුවෙන් නිවාසලාභීන් වෙත ලබා දී තිබූ ණය මුදල රු.3,656,154 ක් වූ අතර එම ණය මුදලට අදාල පොලිය භාණ්ඩාගාරයේ හෝ රේඛීය අමාත්‍යාංශයේ අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල තීරණයක් මත අයනොකිරීමට තීරණය කර තිබුණි. එමෙන්ම මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් අධිකාරියේ අරමුදල්වලින් පොලිය වශයෙන් රු.1,965,468 ක් වැය කර තිබුණි.

(ඇ) 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය දක්වා නාගරික ප්‍රදේශවල ජීවත්වන අඩු ආදායම්ලාභීන්ගේ ජීවන මට්ටම ඉහළ නැංවීම සඳහා නිවාස ව්‍යාපෘති 03 ක් සහ විසිරි නිවාස ණය ලබාදීම වෙනුවෙන් රු.මිලියන 775.06 ක් මහා භාණ්ඩාගාරය මගින් අධිකාරිය වෙත ලබා දී තිබූ අතර ප්‍රතිලාභීන්ගෙන් අයකර ගැනීමට අපේක්ෂිත වාරික වටිනාකම සමාලෝචිත වර්ෂය අවසානයට රු.මිලියන 410.40 ක් විය. මෙයින් රු.මිලියන 8.53 ක් අය වී තිබුණ ද එම මුදල් 2008 අංක 36 දරන නාගරික ජනාවාස සංවර්ධන අධිකාරියේ පනතේ 16 වගන්තිය පරිදි අධිකාරියේ අරමුදලකට බැර නොකර අධිකාරියේ අයභාර වියදම් වෙනුවෙන් වැය කර තිබුණි.

(ඈ) සමාලෝචිත වර්ෂය තුළදී මානව සංවර්ධන වැඩසටහන් වෙනුවෙන් ලැබී තිබුණු රු.මිලියන 20 ක් අතුරින් රු. මිලියන 5.17 ක් එම වැඩසටහනට ඇතුළත් නොවූ ලෝක ජනාවාස දින වැඩසටහන වෙනුවෙන් වියදම් කර තිබුණි.

**4.5 නිෂ්ක්‍රිය හෝ ඌන උපයෝජිත වත්කම්**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරිය සතු සිංහපුර, අනුරාධපුර හා අඟුලාන ප්‍රදේශවල පැවති නිවාස ක්‍රම 03 ක පවතින නිවාස 48 ක් වසර 1 ත් වසර 3 ත් අතර කාලයක් භාවිතයට නොගෙන වසා දමා තිබීම හේතුවෙන් අධිකාරියට රැස්කර ගත හැකිව තිබූ කුලී ආදායම අහිමිවී තිබුණි.

(ආ) සමාජ සජීවිකරණ වැඩසටහන යටතේ 2014 වර්ෂයේදී සහ 2016 වර්ෂයේදී රු.2,662,065 ක් වැයකර මිලදී ගෙන තිබූ ප්‍රකී මහන මැෂින් 8 ක් හා සාමාන්‍ය මහන මැෂින් 110 ක් සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ප්‍රතිලාභීන් වෙත බෙදාදීමට කටයුතු කර නොතිබුණි.

**4.6 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබා දුන් අධිකාරියේ සම්පත්**

සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ජාතික නිවාස සංවර්ධන අධිකාරිය වෙත හා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව වෙත නිලධාරීන් සිව් දෙනෙකු මුදාහැර තිබුණු අතර සමාලෝචිත වර්ෂයේදී අධිකාරිය විසින් ඒ සඳහා වැටුප් ලෙස රු.1,888,797 ක් ගෙවා තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට රු.1,615,208 ක් ප්‍රතිපූර්ණය කරගත යුතුව පැවතුණි.

**4.7 කාර්යමණ්ඩල පරිපාලනය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) අධිකාරියේ ඉංජිනේරු තනතුරු 02 ක් අනුමත කර තිබුණ ද 2011 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය අවසාන වනවිටත් එම තනතුරු පුරප්පාඩුව පවතින බැවින් අධිකාරියේ ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කිරීම කෙරෙහි අහිතකර තත්ත්වයක් උද්ගත වී තිබුණි.

(ආ) 2014 නොවැම්බර් 12 දිනැති අංක 25/2014 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අනුව, නිලධාරීන් 21 දෙනෙකු අධිකාරියට බඳවාගෙන තිබුණද එම තනතුරු අනුමත කාර්ය මණ්ඩලයට ඇතුළත් කිරීමට අධිකාරිය කටයුතු කර නොතිබුණි.

(ඇ) රේඛීය අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතියකින් තොරව සමාලෝචිත වර්ෂයේදී හම්බන්තොට දිස්ත්‍රික්කයේ නිවාස අධීක්ෂණ කටයුතු වෙනුවෙන් අභ්‍යාසලාභීන් (පුහුණු) 21 දෙනෙකු බඳවාගෙන තිබුණු අතර ඔවුන් වෙනුවෙන් සමාලෝචිත වර්ෂය තුළදී රු.2,792,250 ක් දීමනා ලෙස ගෙවා තිබුණි.

15

5. තිරසාර සංවර්ධනය
----------------------

5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම
---------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/එස්පී/එස්ඩීජී/17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර “2030 න්‍යාය පත්‍රය” අනුව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතුව පවතින අතර, සමාලෝචිත වර්ෂයට අදාලව අධිකාරිය විසින් තම විෂය පථය යටතට ගැනෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතු ද යන්න පිළිබඳව දැනුවත් වී නොතිබීම හේතුවෙන් තිරසාර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළගා විය යුතු ආකාරය, ඉලක්ක මැන බැලීම සඳහා වන දර්ශකයන් හඳුනාගෙන නොතිබුණි.

6. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය
--------------------------------------

6.1 ප්‍රසම්පාදනයන් සහ කොන්ත්‍රාත් ක්‍රියාවලිය
----------------------------------------

6.1.1 ප්‍රසම්පාදනයන්
-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.3.1 (ආ) ඡේදය ප්‍රකාරව ඉදිකිරීම් ප්‍රසම්පාදන කටයුත්තක් ආරම්භ කිරීමට පෙර, ප්‍රසම්පාදන අස්ථිත්වය විසින් ඉදිකිරීමට අදාළ ඉඩම් අත්කර ගැනීමේ කටයුතු සම්පූර්ණ කර ඇති බව සහ ව්‍යාපෘතිය බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වෙනත් සියලු කරුණු ඉටුකර තිබිය යුතු වුවද, සමාලෝචිත වර්ෂය අවසාන වන විට රු.1,233,367,544 ක් වැය කර ඉදිකර තිබූ ලුනාව නිවාස ව්‍යාපෘතියට සහ රු.63,070,626 ක් වැයකර ඉදිකර තිබූ තලවකැලේ ලිඳුල නිවාස ව්‍යාපෘතියට අයත් ඉඩම්වල අයිතිය ලබාගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 5.4.6 වගන්තිය සහ 2016 ජනවාරි 25 දිනැති 29 වැනි අතිරේඛය ප්‍රකාරව ඉදිකිරීම්වැඩ කොන්ත්‍රාත් සඳහා කොන්ත්‍රාත්කරුවකුට ගෙවීම් කිරීමේදී ඉදිකිරීමේ දෝෂ ආවරණය කරගැනීම සඳහා රඳවා ගැනීම් මුදලක් (Retention) අඩුකර ගෙවීම් කළ යුතු වුවද, ලුනාව නිවාස ව්‍යාපෘතියේ කොන්ත්‍රාත්කරු වෙත සමාලෝචිත වර්ෂය තුළ ගෙවන ලද රු.42,298,416 කට අදාල අතුරු ගෙවීම්වලින් රඳවුම් මුදල් අඩුකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.4.6 හා 2016 ජනාවරි 25 දිනැති අතිරේඛ (supplement) 29 අනුව, ඉදිකිරීම් කොන්ත්‍රාත්තු වෙනුවෙන් අඩුකර ගන්නා ලද රැඳවුම් මුදලින් (retention) සියයට 50 ක් වැඩ අවසන්කර භාරදුන් පසුව හා ඉතිරි සියයට 50 දෝෂ වගකීම් කාලය අවසන් වූ පසුව කොන්ත්‍රාත්කරු වෙත නිදහස් කළ හැකි වුවත් ඊට පටහැනිව කොන්ත්‍රාත්තුවේ වැඩ අවසන් කර අධිකාරිය වෙත භාරදී නොතිබුණු, ලුනාව නිවාස ව්‍යාපෘතියට අදාළව රඳවාගෙන තිබූ මුළු මුදල වූ රු.55,076,250 ක් හා ඊට අමතරව රු.6,507,164 ක් අදාළ කොන්ත්‍රාත්කරු වෙත අවස්ථා 05 ක දී නිදහස් කර තිබුණි.

(ඈ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.8.1 (අ) වගන්තිය අනුව කිසිම සාමාජිකයෙකු ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණික ඇගයීම් කමිටුව යන කමිටු දෙකේම සේවය නොකල යුතු වුවද රු.688,113 ක ලිබඩු සහ කාර්යාල උපකරණ මිලදී ගැනීමට අදාළ ප්‍රසම්පාදන 02 කදී එකම සාමාජිකයන් පිරිසක් ලංසු විවෘත කිරීම, තාක්ෂණික ඇගයීම් කමිටුව හා ප්‍රසම්පාදන කමිටුව නියෝජනය කර තිබුණි.

(ඉ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1. (අ) වගන්තිය ප්‍රකාරව අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා විස්තරාත්මක ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි.

(ඊ) රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.18 (ආ) වගන්තිය පරිදි, ලංසු ඇගයීමේදී එකතු කළ අගය මත බදු (VAT) සැලකිල්ලට නොගත යුතු වුවද, අධිකාරිය විසින් සිදුකළ සියළුම ප්‍රසම්පාදනයන් ඇගයීමේදී එකතු කළ අගය මත බදු සඳහා ලියාපදිංචි ලංසුකරුවන් එවන ලද ලංසු මිල ගණන් බදු සහිත අගයටද, එම බදු වෙනුවෙන් ලියාපදිංචි වී නොමැති ලංසුකරුවන් එවන ලද ලංසු මිල ගණන් බදු රහිත අගයටද, ඇගයීමට ලක් කර තිබුණි. මෙම තත්ත්වය මත ප්‍රසම්පාදන කටයුතුවලදී බදු සඳහා ලියාපදිංචි නොවූ ලංසුකරුවන්ට වාසිදායක වන අයුරින් අධිකාරිය කටයුතු කර තිබුණි.

(උ) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.3 (ආ) වගන්තිය අනුව ලංසු වැසීමත් සමඟම හැකිතාක් ඉක්මනින් ලංසු විවෘත කිරීම සිදුකළ යුතු අතර ලංසුකරුවන් හෝ ඔවුන්ගේ නියෝජිතයන් ඉදිරිපිටදී ලංසු විවෘත කිරීම සිදු කළ යුතුය. එහෙත් සමාලෝචිත වර්ෂයේදී සිදුකළ රු.1,627,640 ක වටිනාකමින් යුතු ප්‍රසම්පාදන 07 ක ලංසු භාර ගැනීම අවසන් කළ දින සිට, දින 03 ත් දින 110 ත් අතර කාලයක් ලංසු විවෘත කිරීමට ගත කර තිබූ අතර ලංසු විවෘත කිරීම ලංසුකරුවන් ඉදිරියේ සිදු කර නොතිබුණි.

තවද, මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.3.6 ප්‍රකාරව ලංසු විවෘත කිරීම නියමිත ආකෘති පත්‍රයක වාර්තා කර නොතිබුණි.

(ඟ) අධිකාරිය විසින් වර්ෂ 05 ක කාලයක් සඳහා බදු පදනම මත ආසන 8 ක වෑන් රථ 2 ක් හා ආසන 16 ක වෑන් රථයක් ලබා ගැනීම සඳහා 2017 මාර්තු 23 දින ප්‍රසම්පාදන දැන්වීමක් පළ කර තිබුණ අතර ඒ සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(i) 2006 රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 3.2.2 (ඇ) වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ අවසන් දිනට පෙරාතුව වූ දිනය දක්වා ලංසු කැඳවීමේ ලේඛන මිලදී ගැනීමට සැපයුම්කරුවන්ට ඉඩදිය යුතුය. එහෙත් ඉහත ප්‍රසම්පාදන දැන්වීමට අනුව ලංසු කැඳවීමේ අවසන් දිනය 2017 අප්‍රේල් 25 වුවද දින 04 කට පෙර එනම් 2017 අප්‍රේල් 21 දින දක්වා පමණක් ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කර තිබීම විගණනයේදී ප්‍රශ්නකාරී විය.

(ii) මාර්ගෝපදේශ සංග්‍රහයේ 6.1.4 වගන්තිය ප්‍රකාරව ලංසු කැඳවීමේ ලේඛන නිකුත් කිරීමට අදාලව වාර්තාවක් තබා නොගැනීම හේතුවෙන් කොපමණ ලංසුකරුවන් ප්‍රමාණයක් ලංසු ලේඛන ලබාගත්තේ ද යන්න විගණනයේදී තහවුරු කරගත නොහැකි විය.

(iii) ප්‍රසම්පාදන දැන්වීම හා ලංසු ලියවිලි වලට අනුව කුලී පදනම මත ලබාගත යුතු අධිකාරියේ වෑන් රථ අවශ්‍යතාව ආසන 08 ක වෑන් රථ දෙකක් හා ආසන 16 ක වෑන් රථයක් පමණක් වුවද මෙම ප්‍රසම්පාදනය යටතේ ආසන 16 ක වෑන්රථ 03 ක් ලබා ගැනීම විගණනයට පැහැදිලි නොකෙරුණි. මෙම තත්ත්වය මත අධිකාරියට මාසිකව වැඩිපුර ගෙවීමට සිදුවන බදුකුලිය රු.70,000 ක් විය.

### 6.1.2 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

#### (අ) තලවකැලේ ලිඳුල නිවාස ව්‍යාපෘතිය

මෙම ව්‍යාපෘතිය යටතේ නිවාස ඒකක 100 ක් ඉදිකිරීම සඳහා රු.මිලියන 84.5 ක භාණ්ඩාගාර ප්‍රතිපාදන අනුමත කර තිබුණු අතර ව්‍යාපෘතිය 2013 වර්ෂයේ දී ආරම්භ කර 2014 වර්ෂයේ නිම කිරීමට සැලසුම් කර තිබුණි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) සමාලෝචිත වර්ෂය අවසානයට ව්‍යාපෘතිය වෙනුවෙන් භාණ්ඩාගාර ප්‍රතිපාදන ලෙස රු.මිලියන 76 ක් ලැබී තිබුණද ප්‍රතිපාදනවලින් සියයට 83 ක් හෙවත් රු.මිලියන 63.07 ක් පමණක් උපයෝජනය කර තිබූ අතර ඉදිකළ යුතු නිවාස ඒකක 100 න් නිවාස ඒකක 54 ක් පමණක් ඉදිකර අවසන් කර තිබුණි. එමෙන්ම වැඩ අවසන් කළ නිවාස වර්ෂ 03 ක පමණ කාලයක් ප්‍රතිලාභීන්ට භාර නොදී වසා දමා තිබීම හේතුවෙන් එම නිවාසවලට විශාල ලෙස හානි සිදුවී තිබුණු අතර ඒවා ප්‍රතිසංස්කරණයට අධිකාරියට නැවත වරක් වියදම් දැරීමට සිදුවන බව ස්ථානීය විගණන පරීක්ෂාවේදී වැඩිදුරටත් අනාවරණය විය. තවද, නිවාස ව්‍යාපෘතියට අයත්වන ඉඩමේ අයිතිය මෙම වාර්තාවේ දින වන විටත් අධිකාරිය වෙත පවරාගෙන නොතිබුණි.

(ii) ව්‍යාපෘතිය මගින් පුනස්ථාපන පදනම මත නිවාස ඒකක 60 ක් ලබාදීමට සැලසුම් කර තිබුණද නිවාස ඒකක 54 ක් පමණක් ඉදිකර තිබූ බැවින් ප්‍රතිලාභීන් 06 දෙනෙකුට නිවාස ඉදිකර නොතිබූ අතර ව්‍යාපෘතියේ අරමුණුවලට පටහැනිව පුනස්ථාපනය කිරීමට අදාල නොවන බාහිර පුද්ගලයින් 16 දෙනෙකුටද ව්‍යාපෘතිය තුළ නිවාස වෙන්කර ඇති බව වැඩි දුරටත් අනාවරණය විය.

(iii) නිවාස ව්‍යාපෘතියේ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමේ කොන්ත්‍රාත්තුවේ කොන්ත්‍රාත්කරු ඉදිරිපත්කළ කාර්ය සාධන බැදුම්කරය 2017 ජනවාරි 16 දිනෙන් අවසන්ව තිබුණ ද කොන්ත්‍රාත් කාලසීමාව දීර්ඝ කර නොතිබුණු අතර 2018 ජුනි වන විටත් කොන්ත්‍රාත් කටයුතු අවසන්ව නොතිබුණි.

(ආ) **හලාවත නිවාස ව්‍යාපෘතිය**

හලාවත නිවාස ව්‍යාපෘතියේ කාණු පද්ධතිය සැකසීමට 2015 වර්ෂයේදි රු.මිලියන 2.86 ක් මහා භාණ්ඩාගාරයෙන් අධිකාරියට ලැබී තිබුණ ද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් එම කාර්යය ඉටුකර නොතිබුණි. කෙසේ වෙතත් ඉදිකිරීම සඳහා 2017 අප්‍රේල් 19 දින පුවත්පත් දැන්වීමක් මගින් මිල ගණන් කැඳවා තිබුණ ද ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.2.1 අනුව, කොන්ත්‍රාත්තුව සඳහා ලංසුකරුවන් සපුරා තිබිය යුතු සුදුසුකම් හා උපමාන, ලංසු සුරක්ෂණ හා එහි වටිනාකම්, ලංසු වලංගු වියයුතු කාලය, කොන්ත්‍රාත් කාලය වැනි තොරතුරු ලංසු ලියවිලිවල ඇතුළත්ව නොතිබූ නිසා ලද මිල ගණන් ප්‍රතික්ෂේප කර නැවත මිල ගණන් කැඳවීමට අධිකාරිය තීරණය කර තිබුණි. නමුත් 2018 ජුනි 01 දින වන විටත් නැවත මිල ගණන් කැඳවීමට අධිකාරිය අපොහොසත්ව තිබුණි.

### 6.1.3 ප්‍රමාද වූ ව්‍යාපෘති

අධිකාරිය විසින් ඉකුත් වර්ෂයේදී ඉදිකිරීම් ආරම්භ කිරීමට සැළසුම් කළ ව්‍යාපෘති වටිනාකම රු. බිලියන 13.43 ක් වූ, මහනුවර මහයියාව නාගරික නිවාස ව්‍යාපෘතියේ වැඩ සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් ආරම්භ කිරීමට කටයුතු කර නොතිබුණි. සුදුසුකම්ලත් ආයෝජකයකු ව්‍යාපෘතිය සඳහා තෝරා ගැනීමට අධිකාරියට නොහැකි වීම මෙම තත්ත්වයට බලපා තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසාන වන විට මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් දරන ලද වියදම රු.997,801 ක් විය.

## 6.2 අභ්‍යන්තර විගණනය

අනුමත කාර්ය මණ්ඩලය තුළ අභ්‍යන්තර විගණක තනතුර පමණක් අනුමත කර තිබුණු අතර මේ පිළිබඳව පසුගිය විගණකාධිපති වාර්තාවලින්ද පෙන්වාදී තිබුණ ද සමාලෝචිත වර්ෂයේදී ද අභ්‍යන්තර විගණන අංශය ශක්තිමත් කිරීමට කටයුතු කර නොතිබුණි. තවද සමාලෝචිත වර්ෂය වෙනුවෙන් අනුමත විගණන සැලැස්මෙහි ඇතුළත් විගණන වැඩසටහන්වලින් ඇතැම් ව්‍යාපෘතිවලට අදාල ක්ෂේත්‍ර පරීක්ෂණ වැඩසටහන් හා ස්වශක්ති මානව සංවර්ධන යන වැඩසටහන් ක්‍රියාත්මක කර නොතිබුණු අතර අධිකාරියේ කාර්යසාධනය ඇගයීමට අදාල වැඩසටහන්, සැලැස්ම තුළ අන්තර්ගතව නොතිබුණි.

## 6.3 අයවැය පාලනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ඇතැම් ආදායම් හා වියදම් විෂයයන් වෙනුවෙන් ඇස්තමේන්තු සකස් කර නොතිබුණ අතර අයවැය ගත වියදම හා සත්‍ය වියදම සැසඳීමේදී සියයට 37 සිට සියයට 568 දක්වා සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව නිරීක්ෂණය විය.

(ආ) ගාල්ල රජගම සහ හොරණ හැගල්ලවත්ත නිවාස ව්‍යාපෘතිවල ප්‍රචාරණ කටයුතු වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ දී රු.684,526 ක් වැය කර තිබුණ ද එම වියදම සඳහා වාර්ෂික ඇස්තමේන්තුවල ප්‍රතිපාදන සලසා නොතිබුණි.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.3 ඡේදය පරිදි ආයතනය විසින් සිය වාර්ෂික වාර්තාව, ගිණුම් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත පාර්ලිමේන්තුවේ සභාගත කළ යුතු වුවද 2014 වර්ෂයේ සිට 2016 වර්ෂය දක්වා වූ වාර්ෂික වාර්තා, 2018 මැයි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 6.5 නොවිසඳී ඇති විගණන ඡේද

අධිකාරියේ කාර්යාල ගොඩනැගිල්ලක් අළුත්වැඩියා කිරීම වෙනුවෙන් ශ්‍රී ලංකා ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවට ගෙවිය යුතු රු.3,891,911 ක් නිරවුල් කිරීමකින් තොරව අධිකාරියේ ආදායමට බැර කර තිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින්වර අධිකාරියේ සභාපතිවරයා දැනුවත් කරන ලදී. පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමුකළ යුතුවේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) ගිණුම්කරණය | (i) වත්කම් හා වගකීම් නිවැරදිව වර්ගීකරණය කර නොතිබීම.<br>(ii) වත්කම්වල පිරිවැය හා ක්ෂය නිවැරදිව හඳුනාගෙන ගිණුම්ගත නොකිරීම. |
| (ආ) මූල්‍ය කළමනාකරණය | (i) අදාල කාර්යය නිමවූ වහාම අත්තිකාරම් නිරවුල් කිරීමට කටයුතු කර නොතිබීම.<br>(ii) විවිධ වැඩසටහන් සඳහා ලැබුණු රාජ්‍ය ප්‍රදාන එම අරමුණෙන් පරිබාහිර කටයුතු සඳහා භාවිතා කිරීම හා රාජ්‍ය ප්‍රදාන වලින් වියදම් නොකරන ලද ශේෂය භාණ්ඩාගාරයට නැවත ප්‍රේෂණය කර නොතිබීම.<br>(iii) ණය ගිවිසුම් ප්‍රකාරව ණය වාරික අයකර ගැනීමට කටයුතු කර නොතිබීම හා ණය අයකර ගැනීමේ ප්‍රගතිය පහල අගයක පැවතීම. |
| (ඇ) කාර්ය මණ්ඩල පරිපාලනය | පුරප්පාඩුව පවතින අධිකාරියේ තනතුරු සඳහා බඳවාගැනීමට කටයුතු නොකිරීම, අනුමත කාර්ය මණ්ඩලය ඉක්මවා බඳවා ගැනීම් සිදුකර තිබීම හා ඇතැම් තනතුරු නිවැරදිව ශ්‍රේණිගත කර නොතිබීම. |

21

| | |
|---|---|
| (ඇ) ප්‍රසම්පාදනය | (i) එක් එක් ප්‍රසම්පාදනයන් වෙනුවෙන් වෙනම ලිපිගොනු පවත්වාගෙන යාම වෙනුවට එක් වත්කම් කාණ්ඩයකට අදාළ සියළුම ප්‍රසම්පාදනයන් එකම ගොනුවක් තුළ පවත්වාගෙන යාම හේතුවෙන් ප්‍රසම්පාදනයන් වෙන් වෙන් වශයෙන් හදුනාගැනීමට නොහැකි වීම.<br>(ii) ප්‍රසම්පාදන අංශයේ මැදිහත් වීමකින් තොරව ප්‍රසම්පදාන සඳහා පුවත්පත් දැන්වීම් පලකිරීම. |
| (ඉ) වාහන ලේඛන පවත්වාගෙන යාම | (i) වාහන ලොග් පොත්වල ගමන් පිළිබඳ මාසික සාරාංශයක් ඇතුළත් නොකිරීම.<br>(ii) මාසිකව රජයේ වාහන සඳහා භාවිතා කළ ඉන්ධන ප්‍රමාණය, ධාවනය කළ කිලෝ මීටර් ගණන, මාසය තුළ කළ අළුත්වැඩියාවන් යනාදිය ඇතුළත් කොට ප්‍රවාහන සේවා සටහනක් සකස්කර නොතිබීම. |

ඩබ්ලිව්.පී.සී.වික්‍රමරත්න
විගණකාධිපති (වැඩබලන)